## **2021/02/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2021/02/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01.** **ආගම සිහි කිරීම**

2021.02.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

අද දින මේ සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමාලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු කොට ඇති සියළුම දෙනා පිළිගනිමින්, වර්ථමානයේ ඇතිවී තියෙන කොවිඩ් වසංගත තත්වය තවම පහව නොගිය නිසා අපේ ප්‍රාදේශීය සභාවත් නිරෝධායන නීති රීති අනුව පවත්වන්න තමයි අපට නියෝග ලැබිල තියෙන්නෙ. ඒ අනුව අද දිනත් ඒ නිරෝධායන නීති රීති එක්ක අපට සභාව කරගෙන යෑමට සිදු වෙනවා. ඒ අනුවයි අදත් මේ ආකාරයට ශාලාව සකස් කරල තියෙන්නෙ. අපේ නිල දැනුම් දීම අනුව අදදින සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා ගාමිණී සුසන්ත මැතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලය මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතාම ගෞරවයෙන් පිළිගනිමින්, අද සභා වාරය වටිනා අදහස් සමග ගමට ප්‍රදේශයට සේවයක් වෙන ආකාරයේ අදහස් ප්‍රකාශ කරමින් ඒ අඩුපාඩු සකස් කරගන්න ඔබතුමන්ලගෙ උපදෙස් අදහස් ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා. එහෙම නම් නැවත වරක් ඔබ සියලු දෙනාම ගෞරවයෙන් පිළිගනු ලබනවා.

**(අ)01. 2021.01.19 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**01. ගරු සභාපතිතුමා විසින් 2021.01.19 දින සභාවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් මිළ කැඳවීම 2021.01.19 දින සභා වාර්තාවට ඇතුලත් වී නොමැති බව පෙන්වා දෙන ලදී.**

**නාගොඩ ප්‍රදේශීය සභාව - මිල ගනන් කැඳවීම 2021**

**පෙරපාසල් දරුවන් සඳහා පොත් හා උපකරණ ලබාදීම මිලගනන් කැඳවීම**

| විස්තරය | ඒ,ජේ,ජී ස්ටේෂනරි ගාල්ල | ජේ,පී. කොමියුනිකේෂන් ඇන්ඩ් බුක් ෂොප් - නාගොඩ | ජයවර්ධන බෙදාහරින්නෝ - ගිංතොට | දුලාරා ස්ටේෂනරි - ගාල්ල | එච්.එන්. ඉලේසිංහ උඩුගම | ඔබාමා මල්ටි ෂොප් - කිතුලම්පිටිය |
|---|---|---|---|---|---|---|
| රූල් නැති පොත් පිටු 80 | නාලක 28.75 | 45.00 | ඇට්ලස් 40.00 | නාලක 30.00 | රත්න 40.00 | ඇට්ලස් 39.80 |
| තනිරූල් පොත් පිටු 80 | නාලක 28.75 | 40.00 | ඇට්ලස් 40.00 | නාලක 30.00 | රත්න 40.00 | ඇට්ලස් 39.80 |
| 1 වසර | | 50.00 | ඇට්ලස් 40.00 | ඇට්ලස් | රත්න 50.00 | ඇට්ලස් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පස්රූල් පොත පිටු 80 | | | | 46.50 | | 39.80 |
| අහල් 1 කොටු පොත් පිටු 80 | නාලක 28.75 | 45.00 | ඇට්ලස් 40.00 | නාලක 30.00 | රත්න 40.00 | ඇට්ලස් 39.80 |
| ඩබල් රූල් පොත් පිටු 80 | නාලක 29.50 | 50.00 | ඇට්ලස් 40.00 | නාලක 51.75 | රත්න 40.00 | ඇට්ලස් 34.80 |
| සී. ආර්. පොත් පිටු 80 | රේන් මාර්ක් 57.50 | 90.00 | ඇට්ලස් 72.00 | පෙන්මාර්ක් 59.00 | රත්න 100.00 | ඇට්ලස් 79.80 |
| කලු ඩ්‍රෝවින් පිටු 80 | ප්‍රින්කො 95.00 | 100.00 | රත්න 90.00 | ප්‍රින්ස් 96.50 | රත්න 100.00 | ඇට්ලස් 92.50 |
| සුදු ඩ්‍රෝවින් පිටු 80 | පෙන්මාර්ක් 80.50 | 95.00 | ඇට්ලස් 85.00 | නාලක 82.50 | රත්න 105.00 | ඇට්ලස් 84.50 |
| ස්ක්‍රැප් පොත් පිටු 80 | ප්‍රින්ස් 97.00 | 95.00 | රිවඩ 115.00 | ප්‍රින්ස් 98.75 | රත්න 85.00 | ධනුෂ්ක 125.50 |
| පැස්ටල් පෙට්ටි පාට 24 | හොම්රන් 160.00 | 200.00 | ක්‍රෙයාන් 120.00 | ඇට්ලස් 156.00 හොම්රන් 158.00 | ඇට්ලස්140.00 | පෙන්ටියම් 136.00 |
| පාට පැන්සල් පාට 24 | එලිපන්ට් /අට්ලස් 304.75 | 220.00 | ඩියෝ 198.00 | එලිපන්ට් 305.00 | රත්න 220.00 | ඇට්ලස් 199.80 |
| පැන්සල් | ධූම් 13.00 | 18.00 | ඇට්ලස් 15.00 | චයිනා 12.00 | රත්න 15.00 | ඇට්ලස් 16.50 |
| මකන කෑලි | ඇට්ලස් 8.50 | 8.00 | ඇට්ලස් 12.00 | 8.30 | රත්න 8.00 | ඇට්ලස් 9.20 |
| කටර් | ඇට්ලස් 11.00/18.00 | 8.00 | ඇට්ලස් 16.00 | ඇට්ලස් 17.50 | රත්න 10.00 | නටරාජ් 13.50 |
| වතුර බොතල් | නො 5 1ලී 135.00 | 220.00 | නො 5 1ලී 135.00 | නො 5 140.00 | නො 5 140.00 | ඇට්ලස් 220.00 |
| ගම් බෝතල් | 50 මිලී 15.00 | 75.00 | ඇට්ලස් 50 මිලී 15.00 | 50 මිලී 16.50 | ලින්ක් 35.00 | 200 ග්‍රෑම් ඇට්ලස් 130.00 |

**ඉහත සංශෝධනයට යටත්ව 2021.01.19 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. විලේගේ අමර ධනංජය මන්ත්‍රීතුමා මාර්ගයෙන් සී/ර ගෝණදෙනිය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය මගින් ඉදිරිපත් කරන ලද එල් 16242 හා එල් 14761 නඩුව සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

ඉහත නඩුව සම්බන්ධව අදාළ සමිතියේ නිලධාරීන් සභාවට කැඳවා අදාළ නීතිඥ මහතාගෙන් උපදෙස් ලබා ගැනීමට තීරණය විය.

02. ගරු සභාපති, කටඹුරාව එක්සත් සහනාධාර සමිතිය මගින් යොමු කරන ලද 2021.02.08 දිනැතිව එක්සත් සහනාධාර සමිති ශාලාවේ ඉතිරි වැඩ නිම කර ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

සමිති ශාලාව පිහිටි ඉඩමේ අයිතිය පිළිබඳව සභාව සතු ලිපි ලේඛන පරික්ෂා කොට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා විය.

03.කේ.එච්.එම්.චමින්ද සදරුවන් මයා, නාගොඩ විසින් 2021.02.08 දිනැතිව ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක් කුලී පදනම යටතේ පවරා ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙම ඉල්ලීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය හිමි විය.

04.කැකුළු පෙර පාසල, නාගොඩ, ගාල්ල විසින් 2021.02.08 දිනැතිව ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන ගා/නාගොඩ කැකුළු පෙර පාසල සම්බන්ධව දෙමව්පියන් විසින් යොමු කරන ලද අභියාචනය සභාගත කරන ලදී.

මෙම පෙර පාසල පවත්වාගෙන යන ස්ථානයේ දරුවන්ට ආරක්ෂාව නොමැති බව පෙනී යන බවත්, වෙනත් සුදුසු ස්ථානයක පෙර පාසල පවත්වා ගෙන යාම සුදුසු බවත් තීරණය විය.

05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ. ලක්රුවන් සම්පත් මහතා විසින් 2021.02.09 දිනැතිව කොට්ටකනාදොළ ඇළ බැම්මක් බැද ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

තාක්ෂණ නිලධාරියෙකු යොමු කර ස්ථානීය පරික්ෂාවක් සිදු කොට වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය.

06. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විදුහල්පති, ගා/මලාමුර ක.වි. , මාපලගම මධ්‍යම විසින් 2021.02.08 දිනැතිව විද්‍යාලීය ක්‍රීඩා පිටියි ගොඩ කර ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ක්‍රීඩා පිටිය ගොඩ කිරීමට අවශ්‍ය පස් ලබා දීමට තීරණය විය.

07. කේ.එච්.එම්. නිශාන්ත ඉඳුනිල් මයා, තාවකාලික රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2021.02.03 දිනැතිව තාවකාලික රියදුරු තනතුර දීර්ඝ කර ගැනීම සඳහා යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය හිමි විය.

08. අනුර දිසානායක මයා, රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2021.02.08 දිනැතිව LL 7103 ටිපර් රථය සම්බන්ධව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**මේ සඳහා සභාවේ අනුමැතිය හිමි විය.**

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

1. **නාගොඩ නගරය සංවර්ධනය කිරීමට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද නාගොඩ නගර සංවර්ධන සැලැස්ම හා ප්‍රාදේශීය සභාව මගින් සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව සභා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2. **දැනට තාවකාලිකව රියදුරු තනතුරෙහි සේවය කරනු ලබන නිශාන්ත ඉඳුනිල් මහතාගේ වසරක සේවා කාලය 2021.03.13 දින අවසන් වේ. ඒ මහතාගේ සේවය තවදුරටත් අවශ්‍ය බැවින් තවත් වසරක කාල සීමාවක් දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරමි.**

   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

3. **කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් විෂබීජහරණ කටයුතු සිදු කිරීම සඳහා අනියම් පදනම මත සෞඛ්‍ය කම්කරුවන් 05 දෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.**

   **ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

4. බටඅත කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ අධ්‍යයන චාරිකාවක් යෑමට සියළුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් සඳහා වැය වන මුදලෙන් එක් ලක්ෂ පනස් දහසක මුදලක් සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5. සේවක සුභසාධනය සඳහා අයවැයෙන් වෙන් කර ඇති රු. 100000.00 ක මුදල වැය කිරීමට යෝජනා කරමි.
ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

6. 2020.12.31 දිනට අදාළව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව සභාව වෙත යොමු කරන අතර, එම වාර්තාව අනුමත කර, එමගින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතියද ලබා දෙන මෙන් යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

7. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පහත නම් සඳහන් මන්ත්‍රීවරුන් හා නිලධාරීන්ගෙන් සමන්විත අපහරණ හා වෙන්දේසි කමිටුව පත් කිරීමට යෝජනා කරමි.
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
චන්ද්‍රිකා දයාවංශ මිය - ලේකම්

| | |
|---|---|
| එම්.ඒ. ඩිලානි චන්ද්‍රප්‍රභා මිය | - ප්‍රධාන කළමනාකරණ සහකාර |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී |
| කේ.එල්.එන්. ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී |
| කේ.ජී. මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී |
| ජී.ඩී.යූ.යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරි |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී |
| මසීදා අන්වර් මෙනවිය | - කළමනාකරණ සහකාර |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර |

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 33 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**2021.02.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 7689.10 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු.1264.80 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 240.00 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2813189405 | -තල්ගස්වල පෙර පාසල | - රු. 313.20 |
| 4507357802 | - සමනල පෙර පාසල | - රු. 276.60 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.2856.90 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 276.60 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 294.90 |
| 8616373802 | - උඩුගම හෝමදොළ පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |

**02. 2021 ජනවාරි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

i. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 5646.40

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722
(2020.12.16- 2021.01.15) - රු. 613.02

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.12.21 – 2021.01.20) -රු. 1048.68
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.12.21- 2021.01.20) -රු. 1643.60

**05 .2021 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4970.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**06. 2021 පෙබරවාරි මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 480.00 |

**2021 ජනවාරි මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

නිමල් වික්ටර් නාගොඩවිතාන මයා - ගරු සභාපති - රු. 4000.00

| | | |
|---|---|---|
| යූ.කේ.ජයන්ත | - මහජන සෞඛ්‍ය පරීක්ෂක | - රු. 600.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරි | - රු. 536.00 |
| කේ.ජී.මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිළධාරී | - රු. 544.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1020.00 |
| ඒ.එස්.මසීදා මිය | - කළමණාකරණ සහකාර | - රු. 770.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 7000.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 4340.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 470.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 350.00 |

**07. අතිකාල දීමනා ගෙවීම්**

**2021 ජනවාරි මස**

| | | |
|---|---|---|
| යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3168.00 |
| කේ.ඩී.එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිළධාරී | - රු. 5248.33 |
| පී.කේ.එම්.වාසනා මෙය | - කළමණාකරණ සහකාර | - රු. 3858.56 |
| එන්.එච්.ඩී.නිරෝෂනී කාන්ති මිය | - කළමණාකරණ සහකාර | - රු. 3999.00 |
| චන්දිමා සෙනෙවිරත්න මිය | - කළමණාකරණ සහකාර | - රු. 4638.80 |
| ඉෂානි දීපිකා මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 4623.20 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහයක | - රු. 920.83 |
| සන්ධ්‍යා මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3466.56 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 7225.40 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.40 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 4243.68 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3146.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 8707.16 |
| කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 5724.50 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 520.00 |
| යූ.ජී. රංජිත් මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1555.00 |
| එම්.එම්.මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 324.99 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1275.00 |

**08. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 ජනවාරි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. උඩුගම සතිපොළ භූමියේ කඩකාමර ඉදිකිරීම කර්මාන්තයේ කම්කරු හා වඩුකාර්මික කුළිය ගෙවීම. - රු.32200.00

iii උඩුගම සතිපොළ භූමියේ නව කඩ කාමර ඉදිකිරීම තර්මාන්තයේ (සෘජු ශ්‍රමික) වඩුකාර්මික හා කම්කරු කුළිය ගෙවීම. - රු.83750.00

iv උඩුගම සති පොළ සෘජු ශ්‍රමික පදනම මත සිදු කිරීමේ කර්මාන්තයේ අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් වියදමු වූ මුදල් ප්‍රතිපුරණය කර ගැනීම - රු. 3600.00

v රාජකාරි අවහයතාවයන් සඳහා අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් ගෙවූ මුදල් ප්‍රතිපූරණය කර ගැනීම. - රු. 2350.00

**09. එම්.ඒ.වසන්ත මයා, රියදුරු, නාගොඩ ප්‍රාදේශීය සභාව**

PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම
ප්‍රතිපූර්ණය කිරීම - රු. 700.00

**10. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 ජනවාරි - රු. 4240.00

**11. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 දෙසැම්බර් - රු. 7160.00
2021 ජනවාරි - රු. 7280.00

**12. උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**
LL 7103 දරණ ට්‍රක් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු.306705.00
LL 7103 දරණ ටිපර් රථයේ පිටුපස බපරය අලුතෙන් සාදා පේන්ට් කර සවි කිරීම
වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 3750.00

**13. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
i ප්‍රධාන කාර්යාලය අල්ත්වැඩියා කිරීමට අදාළව ලබා ගත් පින්සල් සඳහා ගෙවීම - රු. 2425.00
ii තනකොළ කපන යන්ත්‍රයට අවශ්‍යා අමතර කොටස් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 2140.00
iii තනකොළ කපන යන්ත්‍රය සඳහා අවශය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 1725.00
iv තනකොළ කපන යන්ත්‍රය සඳහා අවශය උපාංග ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 1730.00

**14. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා පෙබරවාරි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**15. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
i. උඩුගම සතිපොළ භූමියේ නව කඩ කාමර ඉදිකිරීම කර්මාන්තයේ (සෘජු ශ්‍රමික) ලබා ගත් අමුද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. - රු.126319.50

**16. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.01.19 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 2600.00

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.24430.00

**18. විගණකාධිපති, විගණන කාර්යාලය**
i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**19. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 ජනවාරි) - රු.13000.00

**20. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය සබන් කැට මිළදී ගැනීමේ බිල්පත - රු. 5208.00

ii. ප්‍රාදේශීය සභාවේ 2021.01.19 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 5780.00

**21. යුනයිටඩ් ෆාමා, ගාල්ල**

පෙර පාසැල් දරුවන් සඳහා covid 19 ආරක්ෂා කර ගැනීම සඳහා හා කාර්යාල නිළධාරීන් Covid 19 වලින් ආරක්ෂා වීමට මුහුණු ආවරණ ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 44610.00

**22.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2021 ජනවාරි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2021 ජනවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.2100.00

**23.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2021.01.22 දින කැඳවූ එල් 16242 දරණ නඩුවට අදාළව නීතිඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 3000.00

ii. 2021.01.25 දින කැඳවූ පී 14658 දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 7000.00

iii. 2021.01.25 දින කැඳවූ එම් 343 දරණ නඩුවට අදාළව නීතිඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 5000.00

**24. එච්.කේ. ලක්රුවන් සම්පත් මයා,**

L 15888 දරණ නඩුවට අදාළ 2021.01.20 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු ගෙවීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 2000.00

**25. බී.ජී.එස්.ඩී.ගමගේ,කිතුලම්පිටිය**

පෙරපාසැල් දරුවන් සඳහා පොත් හා අනෙකුත් උපාංග මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 65733.50

**26. ඒ.ජේ. ජී. ස්ටේෂනරි ,කලුවැල්ල**

පෙරපාසැල් දරුවන් සඳහා පොත් හා අනෙකුත් උපාංග මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 98918.75

ප්‍රධාන කාර්යාලය සඳහා අවහය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු.52627.00

**27. ඒ.පී.ජී.නිලූකා මනෝජි උදයංගනී, වත්තහේන**

පෙර පාසැල් දරුවන්ගේ උපාංග හා පොත් පත් ඇසුරුම් කිරීමට අවශ්‍ය බෑග් ලබා ගැනීමට අදාළ මුදල් ගෙවීම. - රු.4050.00

**28. ඒ.එස්.මාෂිදා ,උළුවිටිකේ**

2021 වර්ෂයට අදාළ ආදායම් ගැසට් නිවේදනය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට අදාල ගාස්තු ගෙවීම. - රු.18620.00

**29. සරත් ගමගේ, උඩලමත්ත**

උඩුගම සතිපොළ නව කඩ කාමර ඉදිකිරීම සෘජු ශ්‍රමික කර්මාන්තයේ අවශ්‍ය දැව ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම (පරාල හා පොලු) -රු.155400.00

**30.** **දුලාරා ස්ටේෂනරිස්, වක්වැල්ල**
පෙර පාසැල් ළමුන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමේ බිල්පත පියවීම - රු. 2940.00

**31.** **ඩබ්.ජේ.හර්ෂ ප්‍රභාත් , ගින්තොට**
පෙර පාසැල් දරුවන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමේ බිල්පත පියවීම - රු.48510.00

**32.** **ජයන්ත ඉලේපෙරුමආරච්චි , නාගොඩ**
පෙර පාසැල් දරුවන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමේ බිල්පත පියවීම - රු.3920.00

**රජයේ ආධාර**
**ග්‍රාමීය මාර්ග 1000Km සංවර්ධනය -2019**
33. ප්‍රියදර්ශනාරාම වැඩිහිටි සමිතිය, නාකියාදෙණිය
නෙළුඇල ගමට යන මාර්ගය කිරිමඩුව අසළින් උඩට යන කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල ගෙවීම - රු. 59328.40

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**
**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. මැණික්දොළ කන්ද මාර්ගයේ කඩා වැටුනු පස් ඉවත් කිරීම සහ කාණු කැපීම
ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. බෝගහ හංදිය අසළ (හඟරංවල) ක්‍රීඩා පිටිය පුළුල් කිරීම
ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

03. දික්දොළ තවාන අසළට වැටෙන උඩලමත්ත හඟරන්වල මාර්ගය සංවර්ධනය කිරීම
ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

04. අඳුරු වී ඇති අත්‍යවශ්‍ය ස්ථානවලට වීථි පහන් සවි කිරීම
ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. ඇටඹගහවිල කෘෂි මාර්ගයේ දොළෙකඩේ පිවිසුම අසළ සිළිංඩර් යොදා සපත්තු පාලමක් ඉදි කිරීම

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. වාඩියකන්ද පොදු නාන ළිඳ පිළිසකර කිරීම

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. මාපලගම වෙළෙඳ සංකීර්ණය අලුත්වැඩියා කිරීම -රු. 500,000.00
02. 214 E කැටගොඩ දකුණ සමෘද්ධි මාවත කොරිපස් යොදා සංවර්ධනය කිරීම - රු. 43000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

<u>තුන් හවුල් කැල්ල මහ ගෙදරවත්ත පාලම අළුත්වැඩියාව සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | එන්.එම්.ඒ.අජිත් ,බෙම්බඩ, යටලමත්ත | අයි.කේ.කුමාරසිරි, විනිමුල්ලකන්ද, යටලමත්ත | කේ.වී.ජයලාල් මගහේනවත්ත, යටලමත්ත |
|---|---|---|---|
| කිතුල් පටි යොදා පාලම සකසා නිම කිරීම | 55000.00 | 40350.00 | 24950.00 |

නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් තුන්හවුල්කැල්ල මහගෙදරවත්ත පාලම අළුත්වැඩියා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල **කේ.වී.ජයලාල් මගහේනවත්ත, යටලමත්ත** මගින් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් තුන්හවුල්කැල්ල මහගෙදරවත්ත පාලම අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සමූහ ඡායාරූපය සකස් කිරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | ලක්මාල් ස්ටූඩියො, ගිංතොට, ගාල්ල | සන්සේයා ස්ටූඩියෝ, නාගොඩ, ගාල්ල | මහේෂ් මධු ෆොටෝග්‍රැපි, දන්ගෙදර, ගාල්ල |
|---|---|---|---|
| ඡායාරූපය ලබාගෙන සකස් කර රාමුව සහිතව සම්පූර්ණ කර ලබා දීමට | 1400.00 | 1350.00 | 1500.00 |

| | | | |
|---|---|---|---|
| එක් ඡායාරූපයක් සඳහා | | | |

නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සමූහ ඡායාරූපය සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල **සන්සේයා ස්ටූඩියෝ, නාගොඩ, ගාල්ල මගින්** නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සමූහ ඡායාරූපය සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමාගේ නිල කාමරයට දුරකථනයක් ලබා ගැනීම සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය |
|---|---|
| දුරකථනයක් ලබා ගැනීම Prolink HCD – 130C | 2955.00 |
| | |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමාගේ නිල කාමරයට දුරකථනයක් ලබා ගැනීම සඳහා ලැබී තිබූ මිළ අනුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමාගේ නිල කාමරයට දුරකථනයක් ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ 252-6478 කැබ් රථය අළුත්වැඩියාව සඳහා ලැබී ඇති මිල ගනන්**

| විස්තරය | ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ | චාමර මෝටර්ස්, ගාල්ල | සමන්ත මෝටර්ස්, බද්දේගම |
|---|---|---|---|
| **252-6478 කැබ් රථය අළුත්වැඩියාව** | 513988.00 | 690100.00 | 710310.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ **252-6478 කැබ් රථය අළුත්වැඩියාව සඳහා** සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල **ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ වෙතින්**_නාගොඩ ප්‍රාදේශීය සභාවේ **252-6478 කැබ් රථය අළුත්වැඩියා කිරීම** සුදුසු බව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2021 ජනවාරි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 පෙබරවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 ජනවාරි මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2021 පෙබරවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

❖ 2021 ජනවාරි මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 පෙබරවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, පහුගිය සභාවෙ මම කතා කරපු කරුණට අදාලවම පුංචි කාරණයක් තමයි දැනගන්න තියෙන්නෙ. ඔබතුමා ඒ අවස්ථාවෙ දුරකතනයෙන් අමතලා, උඩුගම නැගෙනහිර ගල්බැඳි දොල හරහා ඉදිවෙන පාලම පිළිබඳව කතා කළා. ඊට පහුවදාම ඇවිල්ලා, වැඩ ආරම්භ කරනවයි කියලා කොන්ත්‍රාත්කරු ඒ අවස්ථාවෙ දැනුම් දුන්නා. ඇත්තටම ඇවිත් දවස් දෙකයි වැඩ කළේ. භාගෙට වැඩකරල දාලා, නැවත ගියා. දැන් නැවත මාසයක් ඉක්ම ගිහින්. තවම වැඩ කරන්න ආවෙ නැහැ. ඊලගට ඒ ගත්තු තහඩු තෙමී තෙමී විනාශ වෙමින් තියෙනවා. ඉතිං මේකට විසඳුමක් ඇත්තෙම නැහැ. දැන් අපි කතා කරපු තැන්වල ඇති තේරුමකුත් නැහැ. අපි හැමතැනම මේ පිළිබඳව කතා කළා. මේ කොන්ත්‍රාත් කරු හුරතල් කර කර තියාගෙන ඉන්නෙ මොකද කියන බරපතල ගැටලුවක් තියෙනවා. පසුගිය කාලෙ අපි කෑ ගහන කොට පාලමේ කොටසක් ආර්.ඩී.ඒ. එක මගින් කළා. ඉතිං ඒ කොටස කළා වගේ මේ කොටසත් කරන්න පුලුවන් නේද? දැන් ස්ලැබ් එක දාන්න තමයි තියෙන්නෙ. එතකොට දැන් කොන්ත්‍රාත් කරු යටතේ තියෙද්දිම ආර්.ඩී.ඒ. එකේ ඍජු ශ්‍රමය යටතේ එක කොටසක වැඩ කළා. එතකොට මම අහන්නෙ ඒ විදිහටම මේ අනිත් ටිකත් නිම කරලා දෙන්න පුලුවන් කම තියෙනව නේද? දැන් මාසයක් ඉක්ම ගිහිල්ලා. ඉතිං මෙයා හැමදාම කරන කාරණය තමයි මේ කරන්නෙ. කෑ ගහන කොට දවසක් එනවා, වැඩ කරනවා, දාලා යනවා. ඉතිං මේකට ප්‍රාදේශීය සභාව හැටියට ඔබතුමාගෙ මැදිහත් වීමක් අනිවාර්යයෙන්ම අවශ්‍යයි. මේ කොන්ත්‍රාත්තුව වහාම අවලංගු කරලා, ඍජු ශ්‍රමය යටතේ මේ පාලමේ වැඩ නිම කරලා දෙන්න කියලා ඔබතුමා ලිඛිතව ඉල්ලීමක් කරන්න. මොකද මේක බරපතල ගැටලුවක්. මටවත්, ඔබතුමාටවත් වඩා මේ රජය දැඩි අප්‍රසාධයට පත්වෙන වැඩක් මේක. නිලධාරි මොනව හරි හේතුවක් නිසා ඒ කරන කාරණය තුලින් ඒ මිනිස්සු දැඩි ලෙස අපහසුතාවයට පත්වෙලා තියෙනව වගේම අපේ රජය දැඩි අපහසුතාවයකට පත්වෙනවා. ඒ නිසා මේකට වහාම පියවරක් ගැනීමේ අවශ්‍යතාවය තියෙනවා. මම නැවත වරක් ඒ කාරණය තමයි කියන්නෙ ඔබතුමා මේකට ලිඛිතව දැනුම් දීමක් කරලා, මේක අවලංගු කරලා, ඍජු ශ්‍රමය යටතේ කොටසක් කරන්න පුලුවන්නම් මම හිතනවා මේ අනිත් ටිකත් කරන්න පුලුවන් අපි කතා කරල ඇහුවම එහෙම බැහැ කියලා කියනවා. කොටසක් කරන්න පුලුවන් වෙන්නත් අනිත් කොටස බැරි වෙන්නත් හේතුවක් නැහැ. ඒ නිසා මේ වෙලාවෙ මම ඒ ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ප්‍රධාන සභාවේ ලේකම්තුමිය ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම සිහිපත් කරනවා. පහුගිය දවස්වල මා ඇතුලු පවුලේ සියලු දෙනා හදිසියේ ලෝකය පුරා විසිරී තියෙන, ලංකාවෙත් පැතිරී තියෙන කොවිඩ් 19 වෛරසයට ගොදුරු වුනා. ඒ වෙලාවෙ සභාව හැටියට සභාපතිතුමත්, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලත්, ලේකම්තුමිය ඇතුලු සභාවේ සියලුම නිලධාරී මණ්ඩලයත් නිතර මා සමග දුරකතනයෙන් සම්බන්ධ වෙමින් මොනවද අපෙන් කෙරෙන්න ඕන කියලා ඇහුවා. මම පළමුවෙන්ම සභාපතිතුමාටත්, සියලුම මන්ත්‍රීතුමන්ලාටත් සභාවේ සියලු දෙනාට ගෞරවණීය

ස්තූතිය පුද කරනවා. මොකද මම ඒ වෙලාවෙ බොහොම අසරණ තත්වයේ හිටියෙ. නමුත් කරන්න දෙයක් නැහැ. මේ වසංගතයට අපේ ගෙදර හතර දෙනෙකුට ගොදුරු වෙන්න සිදු වුනා. ඒ වෙලාවෙ සභාපතිතුමා හැටියට තමන්ට කරන්න පුලුවන් ඒ සහයෝගයන් ලබා දුන්නා. අපේ විපක්ෂ නායකතුමා දවසකට කීප වතාවක්ම කතා කරල මොකක්ද වෙන්න ඕන කියල සොයා බැලුවා. මේ සෞඛ්‍ය නීති රීතිත් එක්ක කෙනෙකුට අපේ නිවසටත් ලගා වෙන්න විදිහක් නැහැ. මේ වෙලාවෙ මම නම් වශයෙන් කියන්නෙ නැහැ. කිව්වොත් සියලු දෙනාගෙ නම් කියන්න ඕන. ඒක නිසා සියලු දෙනාට මේ වෙලාවෙ නැවත වාරයක් මගේ ගෞරවය ස්තූතිය පුද කරනවා.

සභාපතිතුමනි, මම ඒකෙ මුල පොඩ්ඩක් සඳහන් කරන්න ඕන. මොකද විද්‍යුත් මාධ්‍ය වගේම පත්තර වලින් දැවැන්ත ප්‍රහාරයක් මට එල්ල වුනා. මම එයත් ඉවසා දරාගෙන හිටියා. මොකද මේ කොරෝනා වසංගතය මගෙන් සමාජයට ගිය විදිහට තමයි මාධ්‍යවල ප්‍රචාරය වුනේ. මම දැක්ක පහු ගිය සභාවෙත් කතා කරල තිබුනා. සභාපතිතුමත් සඳහන් කරල තිබුනා. මගේ නෝනා ගාල්ලෙ බන්ධනාගාරෙ වැඩ කරන්නෙ. ඒ බන්ධනාගාරෙ නිලධාරියෙක් විදිහට සේවය කරන අතර තුරේ තමයි ඇය ඒ රෝගයට ගොදුරු වුනේ. ඒක සභාපතිතුමා ගිය සභාවෙ සඳහන් කරල තිබුනා. ලංකාවෙම බන්ධනාගාර තුල මේ රෝගය සීග්‍රයෙන් පැතිරෙන කොට ගාල්ල බන්ධනාගාරෙත් රැඳවියන් කීප දෙනෙකුට වැලඳුනාම නිලධාරීන්ටත් ඒ වෛරසයට ගොදුරු වෙන්න සිදු වුනා. ඒක තමයි ඇත්ත කතාව. නමුත් වනමල් පොකුරෙයි කියලා මාධ්‍ය තුලින් ෆේස් බුක් තුලින් මුලු ලංකාව පුරාම පැතිරෙව්වා. අපේ ගයාන් මන්ත්‍රීතුමාට මම ස්තූති වන්ත වෙනවා. ෆේස් බුක් එකේ එහෙම දාපු අයට මම දැක්කා ගයාන් මන්ත්‍රීතුමා කමෙන්ට් එකක් දාල තිබුනා. එහෙම කියන්න එපා කියලා කරුණු කාරණා පැහැදිලි කරල තිබුනා. ඇත්තටම අපි වගේ එහෙම අසරණ වෙච්ච වෙලාවක කවුරු හෝ හරි දේ නොදැන එහෙම කරන එක වැරදියි. නමුත් සමාජයේ ඉන්න මිනිස්සු පිළිබඳ මම හොඳට තේරුම් ගත්තා. මොකද බැරිවුන වෙලාවට වැරදිච්ච වෙලාවට එලව එලවා ගහන සමාජ වට පිටාවක් ඇති වෙලා තියෙන්නෙ. මමයි පුතයි ගෙදර හිටියෙ පුතාට නම් ඒක දරාගන්න බැරි වුනා. ඔහු මාධ්‍ය වලට කතා කරල හැමතැනටම කතා කරල කිව්වා. එහෙම කියන්න එපා මේක ඇති වුනේ මෙහෙමයි ඇත්ත ඇති සැටියෙන් සඳහන් කරන්න කියලා. එතකොට මාධ්‍යවලත් පත්තරවලත් ප්‍රචාරය වෙලා ඉවරයි. අපි මේ සමාජෙ හැටි දන්නවා. ඒ සමාජ වට පිටාවත් එක්ක, දේශපාලන වශයෙනුත් විවිධ පැතිකඩ වලින් අපිට ගහන්න පුලුවන් වෙලාවට ගහනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. අපි ඒ සියල්ල දරාගෙන හිටියා.

සභාපතිතුමනි, මම මේ අනාවැකිය සභාවාර දෙකකට උඩදි කිව්වා. මොකද අපි දැක්කා මේ සෞඛ්‍ය අංශයත්, වර්ථමාන ආණ්ඩුවත් මේ කොවිඩ් වසංගතය ආරම්භ වෙලා පළමු කොවිඩ් රැල්ල බොහොම ලස්සනට මර්ධනය කරලා, පාලනය කළා. හැබැයි එදා මම සභාවෙදි කිව්වා. මේ එන විදිහ බලන කොට ඉදිරියෙදි මේක මහා භයානක තත්වයක් රට තුල ඇතිවෙයි කියලා. ඒ වගේම මම එදා කිව්වා. මේ සෞඛ්‍ය අංශවල හිටපු ප්‍රධාණීන්,මාරු කරලා රජයට හිතවත් පක්ෂපාතී පුද්ගලයන් මේ සෞඛ්‍ය අංශවල ඉහල නිලතල වලට පත්කර ගන්න කොට මේකෙ තත්වය දරුණු වෙයි කියලා. ඇත්තටම ඒක තමයි සභාතිතුමනි වුනේ. මම එදා කිව්වා අනිල් ජාසිංහ මැතිතුමා, ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා වගේ දක්ෂ නිලධාරීන් මේ තත්වය ලස්සනට පාලනය කරගෙන ආවා. නමුත් වත්මන් ආණ්ඩුවෙ තියෙන මේ බලලෝභී දේශපාලන දර්ශනයත් එක්ක. මේ අය තමන්ගෙ 20 වෙනි සංශෝධනය සම්මත කර ගන්න. මේ සියල්ල පැත්තකට දාලා තමන්ගෙ බලය තහවුරු කර ගන්න කටයුතු කළ නිසා තමයි අද මුලු ලංකාවෙ මිනිස්සුන්ට මේ භයානක ඉරනම අත්වෙලා තියෙන්නෙ. අද අපේ ගම්වල හැමතැනම මේ කොරෝනා වසංගතයට ගොදුරු වෙමින් ජනතාව පීඩාවට පත්වෙලා තියෙනවා. ඊයෙ මගේ මහ ගෙදර ඉදිරිපිට නිවසක් නිරෝධායනයට ලක් වුනා. ඒ වගේ දැන් හැමතැනම කොහේ කොතනින් ඉවර වේද දන්නෙ නැහැ. මේ වගේ දෙයක් රටේ ව්‍යාප්ත වීම පිළිබඳව. ඇත්තටම අපි බොහොම කණගාටු වෙනවා. මොකද මේ ලංකාවෙ ජනතාව හැටනව

ලක්ෂයක් අපේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපති කළේ මේ ජනතාව බලා ගනියි කියලා. නමුත් අද අපට පේන ආකාරයට එහෙම දෙයක් සිදු වෙන්නෙ නැහැ. තමන්ගෙ බලය වෙනුවෙන් තමන්ගෙ කටයුතු ටික කරගෙන යනවා. ජනතාව දැවැන්ත පීඩාවකට පත් වෙච්ච මොහොතක්. මම හිතනවා සභාපතිතුමනි, මේ පිළිබඳ කතා කළොත් දීර්ඝව කතා කරන්න වෙනවා. සෞඛ්‍ය අංශ කරන වැඩපිළිවෙල මම දැක්කා. ඇත්තටම මගේ නෝනට පී.සී.ආර්. එක කළේ හතර වෙනිදා. පස්වෙනිදා තමයි පී.සී.ආර්. වාර්තාව ආවෙ. පී.සී.ආර්. වාර්තාව ආවට පස්සෙ නෝනා කරන්දෙනිය ප්‍රතිකාර මධ්‍යස්ථානයට ගෙනිච්චා. අටවෙනිදා තමයි මා ඇතුලු දරුවන්ගේ පී.සී.ආර්. පරීක්ෂණ කළේ. නව වෙනිදා තමයි ඒ පී.සී.ආර්. වාර්තාව ආවෙ. ඒ වාර්තාව එනකොට මගේ දරුවො තුන්දෙනා පොසිටිව් වෙලා එක්ක ගෙන ගියා. මම එදත් කිව්වා මේ සෞඛ්‍ය අංශ කරල තියෙන වැරදි අඩුපාඩු. පස්වෙනිදා නෝන එක්ක ගෙන ගියාට පස්සෙ නව වෙනිද දරුවො තුන්දෙනා පොසිටිව් වෙනකනුත් ගේ විෂබීජහරණය කළේ නැහැ. ඇත්තටම මේක සෞඛ්‍ය අංශවලින් ඒ දේ හරියට සිදු වුනානම් මගේ දරුවො තුන්දෙනා මේ රෝගයට ගොදුරු වෙන්නෙ නැහැ. මොකද නෝනා පොසිටිව් වුනාට පස්සෙ අපේ නිවසෙ ඒ විෂබීජත් එක්ක තමයි අපි ජීවත් වුනේ. නමුත් මම පුලුවන් තරම් ගෙදර තියෙන නෝනගෙ රෙදිත් සෝදලා. සියල්ල අස්පරස් කරලා මම දරුවන්ට ආහාර පාන ගන්න වෙනම පිගන් කෝප්ප සකස් කරල දීලා, මම ඒ අවශ්‍ය ප්‍රතිකාරත් ගෙදරදි කළා. නමුත් කරුමෙට දරුවො තුන්දෙනා ඒ රෝගෙට ගොදුරු වුනා. මොකද මට ලෝභකම තියෙන්නෙ මේ තරුණ පොඩි දරුවොන්ට මේ වෛරසයෙන් ඒ ගොල්ලන්ගෙ අනාගතයට මොන වගේ බලපෑමක් ඇතිවේද කියලා විශ්වාසයක් නැති නිසා. ඒ නිසා මේ සෞඛ්‍ය අංශවල ඒ වගේම රජයේ හරි ක්‍රමවේදයක් සැලැස්මක් නැති නිසා තමයි මට ඒ තත්වය උදා වුනේ. මේක තමයි මුලු ලංකාවෙම තියෙන තත්වය. ඊයෙ පොසිටිව් වෙච්ච ගෙදර ඒ දරුවා වැඩ කරන්නෙ කොග්ගල ගාමන්ට් එකේ. ඒ දරුවා පී.සී.ආර්. කරලා ගෙදර ඉදල තමයි ගිහිල්ල තියෙන්නෙ. පී.සී.ආර්. කරලා ගෙදර එවලා දවස් පහකට පස්සෙ තමයි වාර්තාව ඇවිල්ල තියෙන්නෙ. එතකොට ඒ ගෙදර ඉන්න අයටත් ඒ අවට ඉන්න අයටත් සමහර විට ඒ රෝගය පැතිරෙන්න බැරි නැහැ. ඇත්තටම සභාපතිතුමනි ගෙදර අයට ක්ෂණිකව පී.සී.ආර්. එකක් කරල බලල අනිත් අය නිරෝධායනය කරනවනම් වඩා හොඳයි. හැබැයි එහෙම නෙවෙයි වෙන්නෙ. ඉස්සර වෙලා ගෙදර අය නිරෝධායනය කරනවා. ඒ වගේම වටේ ඉන්න ඒ ගෙදර අය ආශ්‍රය කරපු අයත් නිරෝධායනය කරනවා. දැන් අපේ ගෙදර එහෙමයි වුනේ. අපේ ගෙදර දරුවො හතර දෙනයි මමයි පී.සී.ආර්. කළාට පස්සෙ දරුවො තුන් දෙනයි පොසිටිව් වුනේ. පුතත් මමත් නෙගටිව් වුනා. ඒ වන විට මම ගිහිපු සම්බන්ධ වෙච්ච සියලු දෙනා නිරෝධායනය කරලා දැඩි අපහසුතාවයකට පත්වෙලා. මම හිතනවා මේ රජයත් සෞඛ්‍ය අංශත් මීට වැඩිය සැලසුම් සහගතව ඒ අවශ්‍ය තැනට ඉක්මන් ප්‍රතිකාර කරනවනම් මේ අපරාදෙ විශාල නාස්තියක් ඒ වගේම විශාල ලෙස ජනතාව අපහසුතාවයට පත්වීමත් වලක්වන්න පුලුවන්. ඒ සියල්ල වෙන්නෙ හරි සැලසුමක් වැඩපිළිවෙලක් නැති නිසා. ඒක තමයි අද තියෙන තත්වය. අපට ඉදිරිය පේනවා. මේක දැවැන්ත ලෙස මේ රට තුල පැතිරෙනවා. ඒ වගේම මේ වන විට මේකට ප්‍රතිකාර කරන්න අවශ්‍ය එන්නත් ලැබිල තියෙනවා. නමුත් සභාපතිතුමනි, මේ එන්නත් පිළිබඳව අපට දැඩි විශ්වාසයක් තියන්න බැහැ. මොකද පහුගිය දවසක පත්තරේක තියෙනවා මම දැක්කා. මේ එන්නත ලබා දුන්නත් නැවත මේ කොවිඩ් වෛරසය ඇතුල් වෙන්න පුලුවන් කියලා. ඒ වගේ තත්වයක් තියෙද්දි ලෝකය පුරා මේ වෛරසය හැසිරෙන ආකාරය දිහා බැලුවම මේ වෛරසය තව මාසයකින් අවුරුද්දකින් ඉවර වෙයි කියල අපට හිතන්න බැහැ. ඒක නිසා ඔබතුමන්ලා රජයේ උසස් නිලධාරීන් සම්බන්ධ වෙන සාකච්ඡා වලදි මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරලා, පැහැදිලි වැඩපිළිවෙලක් සකස් කර ගන්න. ජනතාව අසීරුතාවයට පත් නොවෙන නියම ක්‍රමවේදයක් හදලා, ඒ වගේම කොවිඩ් ආසාධිතයො හඳුන ගන්න ක්‍රමවේදයක් සකස් කරලා, වැඩ කළොත් මේ අහිංසක මිනිස්සුන්ගෙ මුදල් නාස්ති නොවෙන ආකාරයට වැඩකටයුතු සලසා ගන්න පුලුවන් වෙයි කියලා මම හිතනවා. මේ වෙලාවෙ නැවත වාරයක් භයානක තත්වයක් තිබුනත්, මට දුරකතනයෙන් කතා කරලා අවශ්‍ය කෑම බීම හැම

දෙයක්ම ලබා දී, අපේ මන්ත්‍රීතුමන්ලා සභාපතිතුමා ඇතුලු සියලු දෙනා අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. ඒ නිසයි පොඩි හරි අස්වැසිල්ලක් මට තිබුනේ. මම දවස් විස්සක් විතර නිවසටම වෙලා රැදී සිටියා. අපි මේ සෞඛ්‍ය නීති රීති අකුරටම ක්‍රියාත්මක කළා. මේ ලෙඩේ අපේ ගෙදර අයට හැදුන වගේ ඉන් පිටතට නොයවන්න අපි වගබලා ගත්තා. සභාපතිතුමනි. මොකද එහෙම වුනානම් මා වටේ හිටපු නිරෝධායනය වුන අනිත් අහිංසක මිනිස්සුන්ට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. අපිට උඩ ඉන්න දෙවියන් රැකවරණය දුන්නා. අපිව බේර ගත්තා. ඒ නිසා අනිත් අයත් නිදහස් වුනා. මේ වෙලාවෙ නැවත වාරයක් හැම වෙලේම මා පිළිබඳ සොයා බැලූ හැම දෙනාටම ස්තූතිය පුද කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, ඔබතුමා දැන් නාගොඩ නගරය සංවර්ධනය කිරීම පිළිබඳව කතා කළා. ඇත්තටම බොහොම හොඳයි. අපේ ප්‍රදේශයේ තියෙන සියලුම රාජ්‍ය ආයතන තියෙන්නෙ නාගොඩ. ඒ වගේම මම මේ වෙලාවෙ මතක් කරනවා. සභාපතිතුමනි, මාපලගම නගරය පිළිබඳව. මාපලගම කියන්නෙ මේ ලංකාවට මහත් කීර්තියක් ගෙනාපු ගමක් ප්‍රදේශයක්. ඒ නිසා මාපලගම නගරය දැන් තියෙන තත්වය ඉතාම කණගාටුදායකයි. ගරු සභාපතිතුමනි, අපි පහුගිය රජය කාලෙ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලක්ෂ දහයක මුදලක් ගෙනැල්ලා, මාපලගම නගරයේ තියෙන පිට්ටනිය වටේ තාප්පයක් ඉදි කරලා වැටක් ගැහුවා. මම හිතන්නෙ මාපලගම නගරයේ තියෙන මේ ක්‍රීඩා පිටිය අපට විශාල සම්පතක් කර ගන්න පුලුවන්. මම පහුගිය කාලෙ සභාවෙ කිව්වා. අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාවට ක්‍රීඩා කරන්න ස්ථානයක් වගේම ක්‍රීඩා උපකරණත් අවශ්‍ය වෙනවා. ලොකු ක්‍රීඩා පිටියක් නිසා ඇවිදින මන්තීරුවක් හදන්න පුලුවන්. මොකද අද ජනතාවට තමන්ගෙ සෞඛ්‍ය රැක ගන්න මේවා අවශ්‍ය වෙනවා. ඒ වගේ විශාල වැඩ කොටසක් කරන්න පුලුවන්. ඔබතුමා මාපලගම වෙළඳ සංකීර්ණය නවීකරණය කරන්න ලක්ෂ පහක මුදලක් වෙන් කළාය කිව්වා. මම බොහොම සතුටු වෙනවා. ඒ වගේම මාපලගම නගරයට අත්‍යවශ්‍යම දේ තමයි වැසිකිලි කැසිකිලි පද්ධතියක්. මේවා තවම ඉදි වුනේ නැහැ. අපි පහුගිය කාලේ රජය යටතේ මේවට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ගෙනාවා. නමුත් ඒවට විවිධ බාධක නිසා ඒ කටයුතු ඉටු කරන්න බැරි වුනා. මොන බාධක තිබුනත්, මේ අවශ්‍ය දේ මාපලගම නගරයට කෙරෙන්න ඕන සභාපතිතුමනි. ඒ නිසා දැන් ඔබතුමාලගෙ පාලන කාලෙ ඔබතුමාලට ලොකු බලයක් තියෙන ආණ්ඩුවක් තියෙන්නෙ. ඒ නිසා මේ පිළිබඳව බොහොම සානුකම්පිතව සිතලා, බලලා, මේ ගම දියුනු කරන්න. මේ මාපලගම ගම කියන්නෙ ලෝකයේ ඉතාම සුප්‍රසිද්ධ ගමක්. අපි ගමේ මන්ත්‍රීවරු හැටියට හැමදාම මාපලගම නගරය සංවර්ධනය වෙනවනම්, අපි බොහොම කැමතියි. ඒ නිසා අපි අපේ පාලන කාලෙ තුලත් මේ පිළිබඳ කතා කළා. නමුත් ඒ අවශ්‍ය මුදල් ගෙනාවත් ඒව කරගන්න අපිට හැකියාවක් ලැබුනෙ නැහැ. මොකද මේ නිලධාරීන් ඒ තීන්දු තීරණ ගන්න තැන්වල තියෙන යම් යම් ගැටලු නිසා. ඒ නිසා ඉදිරියෙදි ඔබතුමාට ඔබතුමාගෙ පාලන කාලය තුල මේ පිළිබඳ අවදානය යොමු කරන්න කියලා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, සමාවෙන්න මම දැන් සභාවාර දෙකක තිස්සෙ කතා කළේ නැති නිසා මම පොඩ්ඩක් කාලය ගන්නවා. මේ වෙලාවෙ තව දෙයක් කතා කරන්න ඕන. අද අපි අපේ පළාත දිහා බැලුවම , මොකද අද අපේ ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්වය පිළිබඳ දැක්කයින් පස්සෙ, ඇත්තටම කණගාටුදායකයි. සභාපතිතුමනි. අද මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා බලන කොට ජනතාව 69 ලක්ෂයක් ඡන්දෙ දුන්න වගේම අනිත් පැත්තට පනස් පන් ලක්ෂයකට එහා ඡන්දය දුන්න වගේම මේ දෙගොල්ලම අද දැඩි පීඩාවට පත්වෙලා තියෙනවා. අද බඩු මිල අහස උසට නැගල තියෙනවා. හාල් කිලෝ එකක්, සීනි කිලෝ එකක්, පරිප්පු කිලෝ එකක් කීයද? හැම දේම මිල ඉහල ගිහිල්ලා. ඒ මදිවට ඊයෙ පෙරේදා ගෑස් සිලින්ඩරයකින් රුපියල් 500 ක් වැඩි කළා. ඉතිං මේව දිහා බලන කොට හැම පැත්තෙන්ම ජනතාව පීඩනයට පත්වෙලා. ඔබතුමාලා බලන්න. දැන් තෙල් මිල ඉහල දාන්න කටයුතු කරමින් යනවා. ඒ වගේ දැවැන්ත පීඩනයක් ජනතාව පිට පටවමින් ඉන්නවා. ඇත්තටම මේ ආණ්ඩුවට මේ පාලකයන්ට මේව දැනෙන්නෙ නැද්ද කියලාමම දන්නෙ නැහැ. තමුන්නාන්සෙලා 15 දෙනෙක් මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉන්නවා. තමුන්නාන්සෙල 15 දෙනා මේ ජනතාව

විදින දුකට වග කියන්න ඕන. සභාපතිතුමනි, තමුන්නාන්සෙත් එක්කෙනෙක්. මොකද පහුගිය ආණ්ඩුව තියෙන කොට ජනතාව පිට බර පැටෙව්වෙ නැහැ. ජනතාවට සහන දිදී ජනතාව ජීවත් කෙරෙව්වා. හැබැයි අද මොකක්ද වෙන්නෙ ජනතාවගෙ ලේ උරා බොමින් මේ ආණ්ඩුව ජීවත් වෙනවා. මේක තමයි ඇත්ත තත්වෙ. ඉතිං මේක ඇත්තටම අපට දරාගන්න බැහැ. අපේ පෞද්ගලික ජීවිතේදීත් අපට පේනවා. අපේ ගෙවල්වල අපි හයදෙනෙක් ගෙදර ජීවත් වෙනවා. අපට යන වියදම. ඉස්කෝලෙ ළමයින්ට පංති වලට හැම පැත්තෙන්ම. මොකද ආදායම අඩුවෙලා, වියදම වැඩිවෙලා. මෙහෙම ගියාම අද මේ රටේ ජනතාවට වෙන්නෙ මොකද්ද?

ඒ වගේම, රංජිත් ජයවීර මන්ත්‍රීතුමා වරායෙ නැගෙනහිර ජැටිය ගැන කතා කළා. දැන් වරායෙ නැගෙනහිර ජැටිය නෙවෙයි බටහිර ජැටිය දීල ඉන්දියාවට සහ ජපානයට. තමුන්නාන්සෙලා මේ රටේ සම්පත් විකුණනවා. අද ගාල්ලෙ තැපැල් කන්තෝරුව තිබුන පරන බිම් කොටස පෞද්ගලික අංශයට විකුනලා. ගාල්ලෙ පොලීසියෙ ඉඩමෙන් කොටසක් පෞද්ගලික අංශයට විකුනලා. මේ වගේ දැවැන්ත රාජ්‍ය සම්පත් විකුනමින් අද මේ ආණ්ඩුව කටයුතු කරන්නෙ. ඒ නිසා මේ එකයි දෙකයි සභාපතිතුමා කිව්වෙ. මේ වගේ දේවල් අද රට තුල සිදු වෙනවා. බොරුවට මුලා වෙලා, ජනතාව රැවටුනා. මේ ආණ්ඩුව පහුගිය ආණ්ඩුව කාලෙ විකුණුවයි කියල කිව්වා. පහුගිය ආණ්ඩුවට විවිධ චෝදනා කළා. එහෙනම් ඔය මහ බැංකු බැඳුම්කරය කරපු අයට දඩුවම් දෙන්න පුලුවන්. පාස්කු ප්‍රහාරය කරපු අයට දඩුවම් දෙන්න පුලුවන්. ඒ මොනවත් නැහැ. අද කටවල් වහගෙන උඩ බලාගෙන ඉන්නවා. ජනතාව දුක් විඳිනවා. ඉතිං ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක තමයි රටේ ඇත්ත තත්වය. මම හිතනවා අද ලංකාවෙ ජනතාව කබලෙන් ලිපට වැටිල තියෙන්නෙ. ඒ නිසා තමන්ගෙන් වෙච්ච වැරැද්ද නිවැරදි කරන්න ඉදිරියෙදි ජනතාව තීන්දුවක් ගනීවි. මොකක්ද. ඒ නිසා මේ වෙලාවෙ ගොඩක් දේවල් කතා කරන්න තිබුනත්, අද අපි සෞභාග්‍යයේ දැක්ම කියලා මේ පළාතෙ කුඹුරු කළා. අද කුඹුරුවලට මොකද වෙලා තියෙන්නෙ. ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා දන්නවා. අද කුඹුරුවලට විවිධ ලෙඩ රෝග ඇවිල්ලා. ඒ වගේම සත්තුන්ගෙන් වන හානිය. ඒ වගේම පහුගිය දවස්වල තමුන්නාන්සෙල කිව්වා. පුරන් කුඹුරු කරන්න බිත්තර වී පොහොර දෙනවයි කියලා. නමුත් පොහොර ටික හම්බ වුනා. බිත්තර වී ටික නැහැ. පුරන් කුඹුරු කරපු ගොඩක් අය බිත්තර වී තමන්ගෙ අතින් දාල තමයි කුඹුරු කළේ. එහෙම කරලත් කුඹුරුවල යම් යම් රෝග තත්වයන් තියෙනවා. විවිධ රෝග තත්වයන් තුල කුඹුරු විනාශ වෙමින් පවතිනවා. මේ වගේ තත්වයක් තමයි අද අපේ පළාත්වල ඇතිවෙලා තියෙන්නෙ.

තව කියන්න බොහෝ දේ තිබුනත් මගේ කතාව මම කෙටි කරනවා සභාපතිතුමනි. මේ වත්මන් ආණ්ඩුව යන ක්‍රමවේදය පිළිබඳව අපට ඉතාමත්ම කණගාටුදායකයි. ජනතාව පීඩාවට පත් කරමින් කර ගෙන යන ආණ්ඩුවේ ජනාධිපතිවරු දෙන්නෙක්. මොකද බැසිල් රාජපක්ෂ මහත්තයයි, ගෝඨාභය මහත්තයයි දෙන්නම ජනාධිපතිලා. මේ දෙන්න පාලනය කරන වැඩපිළිවෙලත් එක්ක අනාගතේ ජනතාවට මොන ආකාරයේ තත්වයක් අත්විඳින්න හැකියාව ලැබෙයි කියලා අපට සිහිපත් වෙනවා. ඉතිං මම හිතන්නෙ මේ වෙලාවෙ නැවත වාරයක් මගේ කතාව අවසන් කරමින්, මම පහුගිය දවස්වල තමුන්නාන්සෙල බෝ කරගත්ත, වවා ගත්ත, කොරෝනා වසංගතයට මටත්, අපේ පවුලෙ අයටත් ගොදුරු වෙන්න සිදු වුනා. ඒ නිසා ඒ වෙලාවෙ තමුන්නාන්සෙලා වචනෙකින් හරි කරන්න පුලුවන් සෑම උදවුවක්ම කළා. ඒ සියල්ලට අපේ පවුලේ සියලු දෙනා වෙනුවෙන් මම නැවත වාරයක් මගේ ගෞරවයත්, ස්තූතියත් පුද කරමින් මේ වෙලාවෙ මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. සභාපතිතුමනි පොඩි අවස්ථාවක් ඉල්ලනවා. මොකද මට ඊයෙ සභාවෙන් ලොකු අසාධාරණයක් වුනා සභාපතිතුමනි. මොකද ඔබතුමා

ලක්‍ෂ දෙකේ යෝජනා ඉදිරිපත් කරන්න කිව්ව වෙලාවෙ, මගේ පාරවල් කීපයක් සංවර්ධනය කරන්න මම සභාවට යෝජනා දැම්මා. යෝජනා දාලා, මට පාරවල් ඇස්තමේන්තතු කරගන්න ඕනෙයි කියලා තාක්ෂණ සේවා නිලධාරීතුමියව දැනුවත් කළා. එතනදි මට ඊයෙ දවස වෙන්කරලා තිබුනා. ඊයෙ දවසෙ එනවයි කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් මම කතා කරල කිව්වා. ඔබතුමත් කතා කරලා කිව්වා හරි මම තාක්ෂණ නිලධාරී එවන්නම් කියලා. ඊට පස්සෙ ලේකම්තුමියට කතා කළාම, ලේකම්තුමියත් කිව්වා උදේ එවන්නම් කියලා. මට පාරවල් ටික පෙන්නන්න කිව්ව නිසා ගරු සභාපතිතුමනි, මම උත්සවයක් තිබිල ඒකටත් ගියෙ නැහැ. මම පාරවල් ටික පෙන්නන්න නැවතිලා හිටියා. ඊට පස්සෙ උදේ නවයෙ ඉඳල මම කෝල් ගත්තා ගත්තා එනවයි එනවයි කියල කිව්වා. නමුත් ආවෙ නැහැ. ඊට පස්සෙ දොලහ වෙද්දිත් මම උඩුගමට වෙලා ඉඳලා, මම ගෙදර ගියාට පස්සෙ සභාවෙන් කතා කරලා කිව්වා දැන් එන්න, සභාවෙන් පිටත් වුනයි, ගිහිල්ල පාරවල් ටික පෙන්නන්න කියලා. ඊට පස්සෙ මම ඇවිල්ලා එතන බලාගෙන සිටියදී හතරට දහයක් තියෙද්දි සභාවෙ කැබ් එක කොතලාවලට යනවා. ඒක නිසා මම කියන්නෙ ඊයෙ දවසම කිසිම සැලැස්මක් නැතිකම නිසා මගේ උත්සවයකට යන්න තිබුන ගමනත් නැති වුනා. මම දන්නෙ නැහැ මොකක්ද මේ සභාවෙ සිදු වෙන දේවල් කියලා. අපේ ජොෂ්ඨ මන්ත්‍රීවරු මේකෙ අඩු පාඩු දකිනවා ඇති. අපට මේ කෙටි කාලය තුල ගොඩාක් දුරට අඩු පාඩු පේනවා. ගරු සභාපතිතුමාගෙ වැරැද්දක් නොවෙන්න ඇති. ලේකම්තුමියගෙ වැරැද්දක් නොවෙන්න ඇති. මේකෙ ඉන්න සියලුම නිලධාරීන් වැරදි කරන්නෙ නැහැ. මම කවදාවත් නිලධාරීන්ට විරුද්දව කතා කරල නැහැ. ගරු සභාපතිතුමනි, නමුත් නිලධාරි එක්කෙනෙක් දෙන්නෙක් හරි මේකෙ ඔබතුමාගේ වැඩපිළිවෙල කිසිසේත්ම ඔවුන් අනුමත කරන්නෙ නැහැ. ඔවුන් අපිට කිසිම ගරුත්වයක් නැතුව කටයුතු කරන්නෙ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙ කවදාවත් මනුස්සයෙක් අපහසුතාවයට පත්කරන්න එපා. ලේකම්තුමියට කතා කළාම ලේකම්තුමිය කියනවා. උඩුගමට එව්වලු. හෝමදොලට එව්වලු. නමුත් හෝමදොලට ආවෙ නැහැ. අපේ සභාවෙ වාර්තාව යවන්න පෙට්‍රල් ගහල බයික් එකක් යවනවා. නමුත් අපේ ගෙදරට නිකන්කැබ් එකෙන් ගිහින් බලලා එනවා. කැබ් එක නිකන් ගිහින් එනවා. වාර්තාව යවන්නෙ බයික් එකක. අර මනුස්සය තෙමි තෙමි ගිහින් වාර්තා ටික බෙදනවා. මම සභාපතිතුමනි කාටවත් චෝදනා කරනවා නෙවෙයි. ලේකම්තුමියගෙ වගකීමක් තියෙනවා. මේක හොයල බලල වැඩ කරන්න. ඒක නිසා මම හිතන්නෙ ලේකම්තුමිය හොයල බලන්න ඕන. මේ යන්න කියපු තැනට ගියාද නැද්ද කියලා. සභාපතිතුමා උත්සවයක ඉඳන් කිව්වා. මම එතනට යන්න කිව්වා. ආවෙ නැද්ද කියලා ඇහුවා. මම දන්නෙ නැහැ සභාපතිතුමනි, අපි මන්ත්‍රීවරු 26 දෙනාටම මොකක් හෝ සාධාරණයක් සභාවෙන් ඉල්ලුවොත්, ඔවුන්ට ඒ සාධාරණය කරන්න ඕන. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාටවත් ලේකම්තුමියටවත් නිලධාරීන්ටවත් සිත් රිදවන්න නෙවෙයි කතා කරන්නෙ. නමුත් නිලධාරි 100% යම වැරදියි කියලා කියන්නෙ නැහැ. කවුරු හරි එක්කෙනෙක් දෙන්නෙක් ඔබතුමා කියන කිසි දෙයක් ගණන් ගන්නෙ නැහැ. අපේ උප සභාපතිතුමා, මේ හිටපු සභාපතිවරු, ජොෂ්ඨ මන්ත්‍රීවරු හැමදාම කියනවා. සභාපතිතුමා මේකෙ මොකක් හරි අඩු පාඩුවක් තියෙනවයි කියලා. නමුත් සභාපතිතුමා හිනාවෙලා කියනවා ඔව් ඔව් ඒක හදා ගන්නම් කියලා. කවදාවත් ඒ දේ හැදෙන්නෙ නැහැ. ඒක නිසා අපි මන්ත්‍රීවරු අද වැටිල තියෙන තත්වය හරිම කණගාටුයි. අපි දන්නෙ නැහැ මේ ගිය සභාවලත් මෙහෙම තිබුනද කියලා. නමුත් අපි ආපු කෙටි කාලය තුල අපට පේනවා අපට කිසිම සාධාරණයක් කෙරෙන්නෙ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් අවසර දෙන්න. මොකද අපේ සමන් මන්ත්‍රීතුමා කල කතාවට මට පොඩ්ඩක් සම්බන්ධ වීමේ අවශ්‍යතාවය තියෙනවා. මොකද එතුමාට වැරදි අවබෝධයක් තියෙනවද මම දන්නෙ නැහැ. ඊයෙ දවසෙ උදේ මම සභාපතිතුමාටත් කතා කළා. ලේකම්තුමියටත් කතා කළා. මොකද මගේ පාසලේ අවශ්‍යතාවයක් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරගැනීමේ අවශ්‍යතාවය

තිබුනා. ඒක නීත්‍යානුකූලව අමාත්‍යාංශය මගින් දැනුම් දීපු එකක්. එතකොට මටත් දැනුම් දීමක් කළා. අද දවස ඇතුලත එනවා කියලා. ඉතිං මමත් බලාගෙන සිටියා. පාසල අවසන් වෙලත් මම රැඳී සිටියා. නමුත් ඒ වෙලාවෙ කෝල් එකක් ගත්තහම මොකක් හරි ගැටලුවක් කිව්වා. එතන මම හිතන්නෙ අපේ වාහනය නොලැබීමේ ගැටලුවක් කිව්වා. මොකක් හරි රාජකාරිමය කටයුත්තකට ගිහිල්ලා. හැබැයි ඊට පස්සෙ මම හිතන්නෙ සවස තුනත් පහුවුනයින් පස්සෙ වගේ දුරකතනයෙන් කතා කළහම, ඉන්න ඕන නිසා මම එවෙලෙත් ඉස්කෝලෙ සිටියා. ඒ නිලධාරි මහත්තුරු මගේ විද්‍යාලයට ගිහිල්ලා ඒ ඇස්තමේන්තුව කළා. ඒකට මම හිතන්නෙ පැය භාගයක් විතර ගත වුනා. එතකොට සමන් මන්ත්‍රීතුමා කියන වෙලාව හරි. පාසලට ඇවිල්ලා තමයි ගියේ. මේ අතරතුරේ මගේ ඉස්කොලෙට ගියපු නිසා මම ඒ පිළිබඳව කරුණු දැක්වීමක් කරන ගමන්ම, අපේ වනමල් මන්ත්‍රීතුමා කතා කරපු ඒවට ඌන පූර්ණ හා උත්තර දෙනවා නෙවෙයි. මේක තමයි ස්වභාවය. මේ සියලු කාලයන් තුල සියලු රජයන් තුල වෙච්ච අඩු පාඩු. ඔබතුමාලගෙ කාලෙ මේව මේ විදිහටම වුනේ නැහැ කියල කියන්න බැහැ. ඒ කාලෙත් කාලෙකට එලවළු මිල ඉහල ගියා. තව කාලෙකට එලවළු මිල පහල ගියා. දැන් ඊයෙ ඊයෙ පෑනුවල මිල ඔබතුමා දන්නවද? මෙහෙමයි ඒකෙදි මම දකින දෙයක් තියෙනවා. දැන් මේ එලවළු මිල වගේ දේවල් පාලනය කිරීමේදී අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙ ආණ්ඩුවද, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙ ආණ්ඩුවද කියන එක ගැටලුවක් තියෙනවා. එලවළු මිල පහත හෙලන කොට තව අර්බුදයක් මතු වෙනවා. එතකොට එලවළු වගා කරුවන්ට ප්‍රශ්නයක් මතු වෙනවා. එලවළු මිල ඉහල යන කොට පාරිභෝගිකයන්ට ගැටලුවක් එනවා. ඉතිං මේක සමව පවත්වාගෙන යාමට මම දකින විදිහට මෙතෙක් හිටපු කිසිම පාලනයක් සමත් වුනේ නැහැ. පවතින වාතාවරණය තුල ඒකට හැකියාව ලැබුනෙ නැහැ. ඒ වගේම එතුමාගේ කතාවෙදි ඉස්මතු වුන කරුණක් පිළිබඳව සඳහන් කරන්න ඕන. ස්වාභාවික ව්‍යසනයකදී වුනත් මම හිතන්නෙ එහෙමම තමයි. සමහර විට ජනතාවගෙ මතයක් තියෙනවා. ඔබතුමන්ලගෙ නම් එහෙම මතයක් නැහැ. ඔබතුමාලගෙ යහපාලන ආණ්ඩුව තිබුනනම් මීට වඩා මේ උවදුර පිළිබඳව මිනිස්සු කොතනද ඉන්නෙ කියන මතය ජනතාව තුල මීට වඩා තියෙනවා. ඒ නිසා ඔබතුමා කියපු කාරණා පිළිබඳව එකඟ විය හැකි තත්වයන් තිබුනත්, මේව පාලනය කරන්න අපේ රජය විතරක් නෙවෙයි. ඔබතුමන්ලගෙ රජයත් ඒකට අසමත් වුනයි කියන එක අපි ඉතාම පැහැදිලිව මේ රටේ ජීවත් වෙච්ච මිනිස්සු හැටියට දන්නවා. ඒ නිසා මේ වෙලාවෙ ඒ ව්‍යසනය උපයෝගී කර ගනිමින් අපේ පවතින වත්මන් රජය අපකීර්තියට පත් කිරීමේ බලාපොරොත්තුවෙන් ඒ කරපු සියලු චෝදනා සාධාරණ නැහැ කියන කාරණය මේ වෙලාවෙ සභිපත් කරමින්, සැමට ස්තුති වන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ පසුගිය සභාවාරෙදිත් ඔබතුමා කොට්ඨාසෙකට රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලබා දෙන්න යෝජනා කරල තියෙනවා. ඒ යෝජනාවෙන්, තමන්ගෙ කොට්ඨාසවල වීදි ලාම්පු යාවත්කාලීන කරන්න බොහොමයක් අය බලාපොරොත්තු වෙනවා. ආසන්න ප්‍රාදේශීය සභාවල කාර්මික නිලධාරි යොදවගෙන හරි, අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉතාම ඉක්මනින් ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියන ගෞරවණීය ඉල්ලීම මේ වෙලාවෙ කරනවා.

ඒ වගේම මේ වෙලාවෙ බරපතල විදිහට අපේ වනමල් මන්ත්‍රීතුමා රජය විවේචනයට ලක් කළා. මේ රෝගය කවුරුවත් ගෙනහැල්ලා අපිට බලෙන් හදන එකක් වගේ අදහසක් තමයි මට එතුමගේ කතාවෙන් හැඟුනෙ. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා වාසීන් හැටියට විතරක් නෙවෙයි. ලෝක වාසීන්

හැටියටත් මේ රෝගය ලෝකෙටම බලපාපු දෙයක්. මේක මේ රටේවත්, ලෝකයේවත් අපට කාටවත් අත් විදින්න බැරි වෙච්ච ව්‍යසනයක්. මේ රට කවුරු පාලනය කළත්, ඒ වගේම මේ ලෝකෙ කවුරු පාලනය කළත්, මේ රෝගයත් එක්ක ගැටිල ජයග්‍රහනය කරන්න ලැබීම ඉතා අසීරු කාර්යයක්. මෙය පිළිකාවකට හා සමානයි. මේක ඉතාම දුර්ලභ රෝගයක්. අපි මේ වෙලාවෙ බුද්ධිමත් විදිහට කල්පනා කළොත්, අපි කාටවත් ඇඟිල්ල දික් කරල වැඩක් නැහැ. ඒ නිසා අපි මේ රෝගයෙන් වැලකීම සඳහා අපි විශාල කැප කිරීමක් කරන්න ඕන. ඒ නිසා මේක මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙ රජයක්ද, වෙනත් රජයක්ද කියන එක නෙවෙයි ගැටලුව තියෙන්නෙ. මේ වැඩපිලිවෙලේ යම් යම් අඩු පාඩුකම් තියෙන්න පුලුවන්. මොකද අපට කියන සැනින් මුදල් රාශියක් වියදම් කරන්න පුලුවන් ආණ්ඩුවක් නෙවෙයි. අපේ රටේ තියෙන ආර්ථිකයත් එක්ක ගත්තම මොන ආණ්ඩුව ආවත් ඒක ඒ විදියම තමයි. අපේ රටේ ඔය හතලිස් අටේ නිදහස ලබා ගත්ත දවසෙ ඉඳලා. මේ දක්වා පාලනය කරපු සියලු දෙනා පක්ෂ පාට බේදයකින් තොරව, මේවට වග කියන්න ඕන. මෙතෙක් අපට නියම ආර්ථිකයක් නිර්මාණය වෙලා නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා. මේ ආර්ථිකය තුල යම් යම් අඩු පාඩුකම් තියෙන්න පුලුවන්. ඒක 100% ක් ඒ අඩු පාඩු අපට හදා ගන්න පුලුවන් කමක් වෙන්නෙ නැහැ. ඒ නිසා සමස්ථ රටක් හැටියට මේ වගේ වැඩපිළිවෙලක් කරන කොට අඩු පාඩුකම් සිද්ද වෙන්න පුලුවන්.

ඒ වගේම වසන්ත මන්ත්‍රීතුමාගේ පවුලේ අයට සිදු වුන ව්‍යසනයේදී අපි සභාවක් හැටියට සියලු දෙනා එදා ශෝබයට පත් වුනා. ඒ නිසා ඔබතුමාගෙ ප්‍රකාශයත් එක්ක මේක මම හිතන්නෙ ඔබතුමාගේ බුද්ධි මට්ටම මැනල බලන්න තියෙන අවස්ථාවක් හැටියට මම සලකනවා. මේ වෙලාවෙදි මම කාටවත් දොස් කියන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. පසුගිය රජය පැවති කාල වකවානුව තුලදි තේ දළු මිල ඉතා පහල මට්ටමක තිබුනෙ. ඒ වගේම ගොරකා සහ ඒ ආශ්‍රිත සුළු අපනයන බෝග සඳහා හොද ආර්ථිකයක් තිබුනෙ නැහැ. නමුත් අද අපි පිළිගන්නවා. සමාන්‍යයෙන් බඩු මිල ටිකක් ඉහල ගිහිල්ලා තියෙනවා. නමුත් අද යම් ප්‍රමාණයකින් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වෙලා තියෙනවා. තේ දල්ලට ලැබෙන මිල, ඒ වගේම අද ඔය සුළු අපනයන බෝග සඳහා පිළිගත හැකි මිලක් අද අපේ රජය ලබා දීල තියෙනවා. ඒ නිසා මේ ව්‍යසනයත් එක්ක, මේ බඩු මිල සංසංදනය කළහම, මේක පාලනය කරගන්න ඉතාම අමාරුයි. අපි හැමෝටම නොයෙකුත් තර්ක තියෙනවා. නොයෙකුත් අය විවිධාකාර විදිහට බලන්නෙ. නමුත් මේ වෙලාවෙ යම් වැඩපිළිවෙලක් යටතේ දැන් සතොස වෙළඳ සැල් හරහා අත්‍යවශ්‍ය බඩු ප්‍රමාණයක් සහනදායී මුදලට ලබා දෙන්න අපේ රජය කටයුතු කරල තියෙනවා. රජයක් හැටියට අපට මේ ව්‍යසනයට මුහුන දෙනව වගේම මේ රටේ ජනතාව ගැනත් හිතනව වගේම, රටේ ඉදිරි අනාගතය පිළිබඳවත් සිතන්න සිද්ද වෙනවා. ඒ නිසා අද ග්‍රාමීය ජනතාවට විශාල වශයෙන් තමන්ගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා 4.78 පොලියට, ඒ වගේම රාජ්‍ය සේවකයින් සඳහා 7% පොලියට, ඒ වගේම නිවාස ණය වගේම සුළු හා මධ්‍ය පරිමාණ ස්වං රැකියාවල නියුතු ඕනම කෙනෙකුට, පක්ෂ පාට බේදයකින් තොරව, බැංකුවට ගිහිල්ලා, තමන්ගේ අවශ්‍යතාවය මත යම් වැඩපිළිවෙලක් තියෙනවනම් ඒ වැඩපිළිවෙල ශක්තිමත් කරගන්න අවකාශ සලසා දීල තියෙනවා. අපේ රජයෙන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගා සිටවන්න ශක්තිමත් පැහැදිලි වැඩපිළිවෙලක් සකස් කරලා තියෙනවා.

ඒ වගේම ගම සමග පිළිසඳරක් වැඩසටහන දියත් කරලා. ඉදිරියෙදි සියලු ගම් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ලංකාවෙම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසකින්ම එක ගමක් සොඳුරු ගමක් හැටියට තෝරගෙන, ඒ සඳහා යටිතල පහසුකම් වගේම ඒ ග්‍රාම නිලධාරී වසමෙ තියෙන මාර්ග පද්ධති සකස් කරන්න අපි දැන් සියල්ල සූදානම් කරල තියෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේත් ග්‍රාම නිලධාරී වසම් 53 න් එක ග්‍රාම නිලධාරී වසමක් සොඳුරු ගමක් හැටියට තෝරගෙන සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේ දැවැන්ත වැඩපිළිවෙලක් සකස් කරල තියෙනවා. නමුත් අපි පිළිගන්නවා. මේ රෝගෙ තත්වය නිසා ආර්ථික වශයෙන් අපිට මරු

පහරක් වැදිල තියෙනවා. ඒ නිසා අපි අපට කරන්න පුලුවන් එකම දේ තමයි. මම එදත් කිව්වා මේ මුඩු බිම් සියල්ලම කෘෂි කර්මාන්තයට යොදවලා, ඒ සඳහා ශක්තිමත් වැඩපිළිවෙලක් හදලා, කටයුතු කරන්න කියන සිහිපත් කිරීම තමයි සෑම කොට්ඨාසයක් තුලම අපට කරන්න වෙන්නෙ. එහෙම වුනොත් අපට මේ වෛරසය විතරක් නෙවෙයි අපේ ආර්ථිකයත් ජයග්‍රහනය කරන්න පුලුවන් වෙනවා

නැවතත් ගරු සභාපතිතුමනි, මම තව පොඩි ඉල්ලීමක් කරනවා. නාගොඩ ඉදලා රැකඩහේන දක්වා යන ප්‍රධාන මාර්ගයේ දවසකට විශාල ජනතාවක් ගමන් කරනවා. අද වෙන කොට ඒ පාරෙ තාර ගැලවිලා වලවල් බවට පත්වෙලා තියෙනවා. මම සම්බන්ධී කරණ කමිටුවටත් මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළා. මේ මාර්ගය කාපට් ව්‍යාපෘතිය සඳහා මැනලා, ටෙන්ඩර් කැඳවලා තියෙනවා. නමුත් ඒකෙ ප්‍රමාදයක් වෙන නිසා, මෙම මාර්ගය පළාත් සභාවට හෝ මාර්ග සංවර්ධන අධිකාරියට පවරගෙන සංවර්ධන කටයුතු කරන්න කියලා. මේ පාර අත්‍යාවශ්‍යම පාරක්. මේ මාර්ගය දිනකට 1000 කට ආසන්න සංඛ්‍යාවක් ගමනාගමන පහසුකම් සලසා ගන්නවා. මේ මාර්ගයේ වලවල් ටික වසා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයක් සභාපතිතුමනි ඔබතුමාගේ විශේෂ අවදානය මේ සඳහා යොමු කරලා, ඒ කටයුත්ත කරන්න. මොකද අපට ලොකු චෝදනාවක් තියෙනවා. මේ පාරෙ දැන් ඇත්තටම ගමන් කරන්න බැහැ. ඒ නිසා ඒ මාර්ගයේ ඒ කාපට් කිරීම කෙසේ වෙතත්, මාර්ගයේ වලවල් ටික සකස් කර දීමට ඔබතුමාගේ විශේෂ මැදිහත් වීම කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම විශේෂයෙන් අපි සතුටු වෙනවා. නාගොඩ නගර සැලැස්ම පසුගිය දිනක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පොඩි රැස්වීමක් පවත්වා නාගරික සංවර්ධන අධිකාරිය මගින් හදුන්වා දීම කළා. මම හිතන්නෙ ඒක අපට ලොකු ශක්තියක් වේවි. ඒ වැඩසටහනින් ඉදිරියෙදි ඒ නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මෙවර දොලොස් වෙනිදා පැවැත්වෙන සම්බන්ධීකරණ කමිටුවට ඒ අදාල සැලැස්ම ඉදිරිපත් කරලා අනුමැතිය ගන්න අපි බලාපොරොත්තු වෙනවා. අනුමැතිය අරගෙන මහා භාණ්ඩාගාරෙන් ඒ අවශ්‍ය මුදල් ලැබුනොත් ඒ කටයුත්ත කරන්න පුළුවන්. විශේෂයෙන් අපේ නාගොඩ නගරය ගත්තම, තවමත් පසුගාමී තත්වයක තියෙන්නෙ.අනිත් හැම නගරයක්ම මීට වඩා දියුනු වෙලා. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒ කටයුත්ත සඳහා විශාල කැප කිරීමක් කරන බව එදා අපට හැගුනා. ඒ නිසා ඒ සඳහාත් අපේ විශේෂ ස්තූතිය මේ වෙලාවෙ ප්‍රධානය කරමින්, සැමට සුබ අනාගතයක් පතමින්, නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. ඔබතුමා පසුගිය සභා වාරෙ ප්‍රකාශ කළා. අපට පවරා ගැනීමට තියෙන තල්ගස්වල ඉඩම සම්බන්ධයෙන්. මම හිතන්නෙ සාකච්ඡා කර කර ඉදලනම් වැඩක් නැහැ. ඉක්මනටම ක්‍රියාත්මක කළොත් හොඳයි. ඒ වගේම සංවර්ධන කටයුතු සඳහා මාපලගමටත් ලක්ෂ පහක් වෙන්කරල තියෙනවා. මාපලගම නගරයෙ වෙළඳ සංකීර්ණයේ තීන්ත ආලේප කිරීමේදී මම හිතන්නෙ තීන්ත කොම්පැනියක් සම්බන්ධ කරගෙන හෝ එයාලගෙ වෙළඳ දැන්වීම් ප්‍රචාරය කරලා හෝ නොමිලේ තීන්ත ලබාගන්න කටයුතු කරන්න. මේ කටයුතු ඉක්මණික් කෙරෙනවනම් හොඳයි.

ඒ වගේම තමයි මම මේ අවස්ථාවෙ විශේෂයෙන් මට දැනුන දෙයක් ප්‍රකාශ කරන්න ඕන. නාගොඩ පොලීස් ස්ථානයට විජේසිංහ කියලා ප්‍රධාන පොලිස් පරීක්ෂක මහත්මයෙක් පැමින සිටිනවා. එතුමා යම්කිසි කාර්යය භාරයක් කරන බව මට පුද්ගලිකව හැඟී යනවා. ඒ මොකද දැන් අපේ ගයාන් මන්ත්‍රීතුමාගෙ හා මගේ කොට්ඨාසෙ යම්කිසි වැටලීම් කීපයක් සිදු කරලා, ඒ වගේම මේ කොට්ඨාසෙ පුරාම විශේෂ වැටලීම් කීපයක් සිදු කරලා මත්පැන් මත් ද්‍රව්‍ය අත්අඩංගුවට අරගෙන තියෙනවා. අපි බලාපොරොත්තු වූ දේ ඒ මහතා ඇත්තටම සිදු කරගෙන යනවා. හැබැයි ඒකට විවිධ බාධා එම ස්ථානයෙන්ම එල්ල වෙන බවත් අපි දන්නවා. එවැනි නිලධාරියෙක් අපේ ප්‍රදේශයට පැමිණීම සම්බන්ධව එතුමට මම ඇත්තටම ස්තුති වන්ත වෙනවා.

ඒ වගේම අප ප්‍රාදේශීය සභාවෙ වසර කීපයක් සේවය කළ දිලිනි මහත්මිය පසුගිය දිනක මෙම ආයතනයෙන් ස්ථාන මාරුවක් ලබා ගියා. එතුමිය අප ප්‍රාදේශීය සභාවට විශාල සේවයක් කළා. අපි කිව්ව ගමන්ම, ඕන වෙලාවක වැඩ බිම්වලට අධීක්ෂණ කටයුතු සඳහා පැමිනෙනවා. ඇය ගැනත් මේ අවස්ථාවෙ සිහිපත් කරනවා. ඒ වගේම නාගොඩ නගර අලංකරණය කිරීමෙදි ධර්මසිරි මන්ත්‍රීතුමත් මට පෙන්නුවා. නගර සංවර්ධන සැළැස්මේ මාර්ග සළකුණු කිරීම වැරදියි, ඒ නිසා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන්න කලින් එම මාර්ග නිවැරදි කර නගර සැළැස්ම සංවර්ධන කමිටුවට යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මම කතා කරන්න නෙවෙයි හිටියෙ. මම හිතුවා සභාවේ කටයුතු ඉක්මනින් අවසන් කරයි කියලා. කොහොම වුනත් ප්‍රශ්න පැන නැඟුන නිසා. ඒකට උත්තර කීපයක් මම දෙන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපේ වනමල් මන්ත්‍රීතුමාගෙ ප්‍රශ්නෙදි ඇත්තටම එතුමා දැක්වූ ඒ කරුණු බොහොමයක් මම අනුමත කරනවා. ඒක අපි දැනගෙන හිටියා. එතුමා වේදනාවකින් කතා කළේ. ඒක නිසා අපි ඒක තවදුරටත් නොවෙන්න, සභාව තුල අපේ නිලධාරි වෙන්න පුලුවන්. අවශ්‍යතාවය මත සම්බන්ධ වන බාහිර නිලධාරි වෙන්න පුලුවන්. ඒ කටයුත්තෙ සම්පූර්ණ වගකීම තියෙන්නෙ කොට්ඨාසයේ සභාපතිවරය හැටියට ඔබතුමාට.

ඊලග කාරණය, තමුන්නාන්සෙලගෙ මන්ත්‍රීවරයෙක් කිව්වා. වසර දෙකහමාරක් තුල ඇත්තටම මන්ත්‍රීවරයෙකුට යම්කිසි අවස්ථාවක් දුන්නට පස්සෙ, ඒ කාරණය තමන්ගෙ පෞද්ගලික කාරණයක් වෙන්න පුලුවන්. එහෙම නැත්නම් ප්‍රදේශයේ ඊටත් වැඩි හදිසි ව්‍යසනයක් වෙන්න පුලුවන්. එහෙමනම් අපට මග හරින්න පුලුවන්. එහෙම නැතුවනම් සභාපතිවරයා බලාපොරොත්තුවක් දුන්නනම්, පක්ෂයේ වෙන්න පුලුවන්, විපක්ෂයේ වෙන්න පුලුවන්. මන්ත්‍රීවරයෙක් පොදු කටයුත්තක් සඳහා යම් ඉල්ලීමක් කලාට පස්සෙ එය ක්‍රියාත්මක කිරීමේ වගකීම සභාපති හැටියට තමුන්නාන්සේ ඒක හරියට නොපිරි හෙලා ඉටුකළ යුතුයි. ඒ දෙන පනිවිඩය, නියෝගය ඒක අවසන් නියෝගය විය යුතුයි. ඒක නිසා තමයි අද තමුන්නාන්සෙ මම හිතන්නෙ මේ තරම් බැට කන්නෙ.

ඒ වගේම සෞඛ්‍ය අංශය ගැන කියන කොට තමුන්නාන්සෙලා දැන් මේ ඉතිහාසය ගැන කිව්වා. ඉතිහාසෙ එදා ආණ්ඩුවත් එහෙමයි කියලා. ඉතිහාසෙ මම කියන්නම්. ගිය සතියේ මගේ ළඟ සේවය කරන පුද්ගලයෙකුට සිදු වුන අත්දැකීමක් මම කියන්නම්. ඇස්වල පෙනීම නැති වුනාම, බද්ධ කරන සිව් කාචෙ, අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ඒ සිව් කාච දුන්නෙ නොමිලේ. සැත්කම කළේ නොමිලේ. මම හිතන විදිහට බොහොම සුලු ගානක් ගත්තා. මගේ ළඟ වැඩ කරන පුද්ගලයා ගිය සතියෙ රෝහලට ගියා. ඉන්ජෙක්ෂන් එකට 20,000 යි. සිව් කාචෙට 75,000 යි. ඔන්න තමුන්නාන්සෙලගෙ ගමන කොහොමද කියලා. ඒක සාමාන්‍ය පුද්ගලයෙකුට අද කරන්න දරාගන්න බැරිවෙලා තියෙනවා.

ඊලගට අද 1990 නැත්නම් අද කොරෝනා හැදිච්ච භාගයක් මැරිලා. අද ගෙනියන්න වාහනයක් නැහැ. එදා ඉතිහාසෙ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුල සෞඛ්‍ය අංශය දියුණු කිරීම තුල තමයි. අද මේකට මුහුන දෙන්නත් පුලුවන් වෙලා තියෙන්නෙ. ඒක නිසා මේ වෙලාවෙ තමුන්නාන්සෙල කිව්වා. බඩු මිල ගැන. මම කෙටියෙන් හැම දෙයක්ම කියන්නම්. අපේ වනිගරත්න මන්ත්‍රීතුමා කිව්වා බඩු මිල සම්බන්ධව. ගරු මන්ත්‍රීතුමා මතක තියා ගන්න. ඒ ආණ්ඩුව තුල ව්‍යසන එකක් දෙකක් නෙවෙයි. කුනු කන්ද කඩා වැටුනා, ඊලගට බෝම්බ පිපිරුවා. සාලාවෙ හමුදා අවි ගබඩාව පිපිරුවා. ඒ විතරක් නෙවෙයි. අපේ ලොකුම ව්‍යසනය සිද්ද වුනා. පල්ලියෙ පාස්කු ප්‍රහාරය. ඉතිං ඒක වුනාම අපිත් හිතුවා ආණ්ඩුව කඩා වැටෙයි, රට කඩා වැටෙයි කියලා. ඉතිහාසෙ එදා බඩු මිල අඩු කරපු බඩු මිලම තමයි අද තියෙන්නෙ. පෙට්‍රල් මිල එදා අපේ ආණ්ඩුව ඇවිලා අඩු කෙරුවා. අද තවම ඊට වැඩිය ලෝක වෙළඳ පොළේ මිල බැස්සත් අඩු කරන්න බැරි වුනා. එදා ගෑස් එක අඩු කළා. අපි 2800 ට 3000 ට ගෑස් එක ගත්තෙ. තවමත් 1500 ට 1600 ට ගෑස් එක ගන්නවා. ඒ අඩු කරපු අඩු කිරිල්ල තමයි තවමත් තියෙන්නෙ. දැන් වසන්ත මන්ත්‍රීතුමා කිව්වා. ගෑස් එකකින් රු. 400 ක් 500 ක් වැඩි වෙනවයි කියලා. ඒක මම දන්නෙ නැහැ. අහිංසක දරුවන්ගෙ කිරි පිටි එක එදා ආණ්ඩුවෙන් අඩු කෙරුවා. අද ඊට වැඩිය රුපියලක් අඩු කරන්න බැරි වුනා. මේ වගේ ව්‍යසන පුරුදු වෙන්න ආවෙ නැහැ. අපි හිතුවා ඒ වගේම විදේශිකයන් මේ රටට එන එක නවතී කියලා. මාසයක් ඒ වගේ තිබුනෙ නැහැ. ඒ කර්මාන්තය එදා වගේම මාස දෙකක් තුනක් යන කොට ඒ ආණ්ඩුවට සකස් කරන්න පුලුවන් වුනා. ඒක තමයි ඉතිහාසය. ඒ වගේම ආණ්ඩුවක් හැටියට ඒකට මුහුන දෙන්න වෙනවා. ඒ ආණ්ඩුවද, මේ ආණ්ඩුවද කියල නෙවෙයි. මේ ලෝකෙ මේ වගේ ව්‍යසන සිද්ද වෙනවා. එදා මුහුද ගොඩ ගැලුවා. මේ වගේ ව්‍යසන පුරුදු වෙන්න ආවෙ නැහැ. සැලැස්මක් හදන්න තමයි ආණ්ඩුවක් පත් කරන්නෙ. ඒ නිසා තමයි ජනතාව කියන්නෙ ආණ්ඩුව ෆේල් කියලා. කිසිම දෙයක් අද සැලැස්මක් නැහැ. ගැසට් ගහනවා. ඊයෙ පෙරේද මම අහගෙන ඔන්න කිරිපිටි අඩු කෙරුවා.ඇනු අඩු කෙරුවා, හාල් අඩු කෙරුවා කියලා ලිස්ට් එකක් කියාගෙන කියාගෙන ගියා. මම ඊයෙ සතොසට ගියා. හාල් කිලෝ එක 125 යි. කැකුළු හාල් විතරක් රුපියල් 93 ට තියෙනවා. සීනි කිලෝ එක 145 යි. ඒක අඩු වෙලා නැහැ. කිසිම දෙයක් අඩු වෙච්ච දෙයක් සතොසෙත් නැහැ. අන්න ඒ වගේ තමයි අද මේක කතා නොකර හිටියොත් කතා නොකර අපි මෙතනින් ගියොත් අඩුම ගානෙ ජනතාව අපිට අද දීමනාවක් දෙනවා. ඒ දීමනාව දෙන්නෙ මෙතනට ඇවිල්ල මේ පනිවිඩයවත් දෙන්න කියන්න. අන්න ඒක නිසා මම හිතනවා. මේ ආණ්ඩුව ෆේල් කියන එක දෙසැරයක් අපි කියන්න අවශ්‍ය වෙන්නෙ නැහැ.

අද පාසල් විවෘත කරල තියෙනවා. ගුරුවරයෙක් හැටියට තමුන්නාන්සෙ දන්නවා. දෙමව්පියො අද කොච්චර බියකින්ද පාසලට ළමයා එවන්නෙ කියලා. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලෙ රනිල් වික්‍රමසිංහ මහත්තයා අර ටැබ් එක දෙන්න හදන කොට, මේ ආණ්ඩුව ඇවිල්ල තමයි නතර කෙරුවෙ. අද ටැබ් එක දීල තිබුනනම් ළමයි සියළු දෙනාම අධ්‍යාපනය ලබනවා. මම මීට කලින් මේ ගැන මතක් කෙරුවා. අද අහිංසක දරුවොන්ට, සියලු දෙනාටම අධ්‍යාපනය ලබන්න බැරි වෙලා තියෙනවා. වැඩිහිටියෙක් විදිහට මම දකින විදිහට ගුරුවරයෙක් ගාවට ළමයෙක් යන්නම ඕන. ඒක අපි දකිනවා. නමුත් අද ඔන්ලයින් ක්‍රමයට අධ්‍යාපනය ලබන්න මේ රටේ සියලුම ජනතාවට බැහැ. එක පංතියක් අධ්‍යාපනය ලබාවි. අහිංසක අම්ම තාත්තගෙ දරුවො ගෙදර ඉදල කදුලු සලාවි. එහෙම නම් එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ කරන්න හදපු දේ ඒ විදියට කළා නම් කොපමන වටිනවද. එදා නිදහස් වෙළඳ ආර්ථිකය නිසා. රූපවාහිනිය මෙහෙට ආවා. ඔය සාක්කුවෙ තියෙන ෆෝන් එක එදා ආණ්ඩුවෙන් හදුන්වල දුන්නෙ. ටැබ් එක, පරිගණකය මේවා හදුන්වල දුන්නෙ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. ඉතිහාසය අමතක වෙලා ඇති. එහෙම නම් තමුන්නාන්සෙලා කරපු දෙයක් කියන්න. මේ ව්‍යසනයට මුහුන දීපු හැටි කියන්න. කිසිම ආකාරයකින් දක්ෂ වුනේ නැහැ. හැම පැත්තෙන්ම ආණ්ඩුව ෆේල් වුනා. ඒක නිසා තමයි අද ජනතා විරෝධයක් ඇවිල්ල තියෙන්නෙ. හෙට පුලුවන් නම් මැතිවරණයකට යන්න. අපේ කුලල් කා ගැනීම් නැතුව ප්‍රතිපක්ෂයක් හැටියට නැගී සිටියොත් අපි

හිතනවා බලය ගන්න පුලුවන්. නමුත් අපි කුලල් කා ගැනීමේ ප්‍රතිඵල තමයි තමුන්නාන්සෙල අද භුක්ති විඳින්නෙ. මම මීට වැඩිය කාලය ගන්නෙ නැහැ. කෙටියෙන් තමුන්නාන්සෙලට ඉතිහාසය හැම දෙයක්ම මතක් කරල දුන්නා. ඒ වගේම එදා 2015 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙ මැතිවරණ පොරොන්දුව තමයි. දලු මිල රුපියල් 50 ට අඩු වෙන කොට අපි ආධාර මුදලක් දුන්නා. අමතකද? මේ කුඩා තේ වතු හිමියො බහුතරයක් ඉන්නෙ. ඒක නිසා අමතක කරන්න එපා. පොහොර මිටිය රුපියල් 1000 ට දුන්නා. ව්‍යසන එක පිට එක ආවා. පොහොර මිටියට අත තිබ්බෙ නැහැ. නිල ඇඳුම් කට්ටලේට අත තිබ්බෙ නැහැ. මම හිතන විදිහට අම්මාවරුන්ට රුපියල් 20,000 ක විතර බඩු මල්ලක් දුන්නා. ඒවට අත තිබ්බෙ නැහැ. මේ සියල්ලම දීලා ඊට අමතරව තමුන්නාන්සෙලගෙ පීඩනයට ලක්වෙලා හිටපු ලක්ෂ ගානකට සමෘද්ධියත් ලබා දුන්නා. එහෙමනම් තව මොනවද කතා.

ජනතාව මේ තීන්දුව ගත්තේ එකක් මතක තියා ගන්න. මේ සභාවෙ මම කාටත් කියනවා. සමගිය බලය වේ කියලා. අසමගිය තුල කරපු ජයග්‍රහනය අද එක්සත් ජාතික පක්ෂෙ විතරක් නෙවෙයි සියලුම රට වැසියො සියලුම දෙනා භුක්ති විඳිනවා. එහෙමනම් මෙන්න මේක තමයි ඉතිහාසය. තවත් ඉතිහාසය මම මතක් කරන්නෙ නැහැ. තමුන්නාන්සෙලට මතක් කරල දුන්නෙ නැත්නම් සමහර වෙලාවට මෙතන අලුත් කෙනෙක් කවුරු හරි හිටියනම් විතරක් මේවටත් රැවටෙයි. ඒ නිසා තමුන්නාන්සෙලට මම කියන්නෙ. මේ ගමන සැලැස්මක් ඇතුව විශේෂයෙන්ම සභාපතිතුමාටත් මම කියනවා. දැන් තමුන්නාන්සෙට විශේෂයෙන්ම ප්‍රශ්න එන්නෙ, සැලැස්මක් නැතිකම නිසා. ඔය පුටුවෙ රස්නය දැනෙන්නෙ නැහැ. ඔය පුටුවෙ වාඩි වුනාම තමුන්නාන්සෙට දැනෙන්න ඕන මම සභාපතියි කියන එක. එහෙමනම් මේක ආයතනයට ආවට පස්සෙ නිලධාරින්ට දැනෙන්න ඕන මේ ඇවිල්ල තියෙන්නෙ සභාපතියි කියන එක. ඒක දැනෙන්නෙ නැහැ. ඒක දැනුනම් තමුන්නාන්සෙට මේ මන්ත්‍රීවරුන්ට මේක වෙන්නෙ නැහැ. අන්න ඒක නිසා මතක තියා ගන්න. දොලොස් දෙනා වෙනුවෙන් නෙවෙයි කතා කරන්නෙ. තමුන්නාන්සෙලගේ 15 දෙනාට අසාධාරනය. අපට නම් වෙන දෙයක් නැහැ. වීථි ලාම්පු දැමීම සම්බන්ධව මම ප්‍රශ්න කරන්න කැමතියි. අනුමත වීථි ලාම්පු කීයක් තිබේද? දැනට වීථි ලාම්පු කීයක් පාවිච්චි වෙනවාද? මේ සම්බන්ධව සටහන් කරලා වාර්තාවක් ඊලග සභාවෙ දෙන්න. මට දැන් අවශ්‍ය නැහැ. තමුන්නාන්සෙලගෙ මන්ත්‍රීවරයෙක් කැබ් එක ඇවිල්ල මේක හයි කරපං කියන කොට ගෝලයො හයි කරල ඉවරයි. ඒකට නෙවෙයි අපි සභාවට එන්නෙ. අපට වේදනාවක් කැක්කුමක් තියෙනවා. අපි කරුවලේ අතපත ගාලා ගෙවල්වලට යන කොට කඩේට ගිහිල්ලා තමන්ගෙ ලැට් එක ගාවටත් හයිකර ගන්න තත්වෙට අද නාගොඩ සභාව පත්වෙලා. අන්න ඒක නිසා මම ප්‍රශ්න කරනවා. අනුමත වීදි ලාම්පු කීයක් තිබේද? විදුලිබල මණ්ඩලෙන් ඒකට මුදල් ලැබෙන්නෙ කීයකටද? ඊටත් පරිබාහිරව කීයක් සවිකර තිබේද? කාගෙ අවශ්‍යතාවයටද? ඒ ප්‍රදේශයේ තියෙන අවශ්‍යතාවය කුමක්ද? කියන එක මම මේ ගරු සභාවෙන් ප්‍රශ්න කරනවා. මම මේක ප්‍රශ්න කරන්න නෙවෙයි හිටියෙ. නමුත් 27 දෙනා අතරින් 12 දෙනෙක් විතර බැට කනවා. ඒ 12 දෙනාට උත්තර නැතුව ඉන්නවා. අන්න ඒක නිසා ඒ 12 දෙනා වෙනුවෙන් මම මේ කතා කරන්නෙ. ඒ 12 දෙනා විතරක් නෙවෙයි 15 දෙනාටත් කතා කරන්න වුනා. කණගාටුවෙන් වුනත් කියන්න වෙනවා. මෙහෙම ගියොත්, ඒ 15 ත් රැක ගන්න බැරිවෙනවා. අන්න ඒ නිසා තමුන්නාන්සෙලා සියලු දෙනාගෙම හදවතට අත තියල බැලුවොත් මේ 27 දෙනාගෙම ගැස්ම එකයි. ආසයි වැඩ කරන්න. ආසයි වීථි ලාම්පුවක් දාන්න. ආසයි කොන්ක්‍රීට් එකක් දාන්න. ආසයි පාරක් හදා ගන්න. හදවතට අත තියල බලන්න. මහජන නියෝජිතයො හැටියට ආසයි කාටහරි උදවුවක් කරන්න. නමුත් 12 දෙනෙකුට විතරක් ඒ උදවුව නැහැ. නමුත් අපි සතුටු වෙනවා. පක්ෂ විපක්ෂ යක් නෙවෙයි වෙන පක්ෂයක මන්ත්‍රීවරයෙක් හරි පාරක කොන්ක්‍රීට් එකක් දානවනම් අපි සතුටු වෙනවා. අපේ කාලෙ මේ වැඩේ කෙරුනයි කියන්න. එහෙමනම් ඒ ශක්තිය තමුන්නාන්සෙට ලබා දෙන්න මේ සියලු දෙනාම ඉන්නෙ. ඒ නිසා මම අවසාන වශයෙන් තමුන්නාන්සෙගෙ මේ ගමන සාර්ථක කරගන්න මම හිතනවා මම කතා කරපු දේවල් වලින් ප්‍රයෝජනයක් ගනියි කියලා. එහෙනම්

තමුන්නාන්සෙලා සියලු දෙනාටම සෞභාග්‍ය උදාවේවා. සියලු බලාපොරොත්තු ඉටු වේවායි කියල ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු සභාවෙන් අවසරයි. ගරු මන්ත්‍රීවරුනි සභාවේ සේවය කරන තාක්ෂණ නිලධාරීන්ගේ සේවය හරි හැටි ඉටු නොවන බව සමන් මන්ත්‍රීතුමාගේ කතාවේදී ප්‍රකාශ වුණා. ඒ පිළිබඳව යමක් ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්. සභාවේ සිටින තාක්ෂණ නිලධාරී දෙදෙනාගෙන් කෙනෙකු තමන්ගේ විවාහ උත්සවය සඳහා නිවාඩු ලබා ගෙන සිටින අතර, අනිත් තාක්ෂණ නිලධාරීතුමිය ස්ථාන මාරුවක් ලැබී ගිය නිසාත්, ඒ වෙනුවට අලුතින් පත්ව ආ නිලධාරීන් දෙදෙනා මේ වන විට තමාගේ රාජකාරි කටයුතු ඇරඹුවද, ප්‍රදේශය හඳුනා ගැනීමට තිබෙන අපහසුතාවත්, මේ කාර්යයන් කිරීමේදී, එයට බලපාන්න ඇති. තවද මේ වෙන කොට වෙනත් ආයතනවලින්ද, අපේ තාක්ෂණ නිලධාරීන් ලවා යම් කාර්යයන් ඇස්තමේන්තු කර ගන්න ඉල්ලීම් එනවා. සභයක් විදියට ඒවා කරදීම අපේ යුතුකමක්. නමුත් නිලධාරීන්ට ඇති අධික වැඩ නිසා ඒවා කරදීමට නොහැකිවන අවස්ථා තියෙනවා. සමන් මන්ත්‍රීතුමාගේ කර්මාන්තය බැලීමට උඩුගම යන කොට වනිගරත්න මන්ත්‍රීතුමාගේ ඉල්ලීමක් වූ එතුමා විදුහල්පතිධුරය දරණ පාසලේ ඇස්තමේන්තුවක් සකස් කිරීමට සිදු වන නිසා සමන් මන්ත්‍රීතුමාගේ කර්මාන්තය බලන්න ගොස් ඇත්තේ ප්‍රමාද වෙලා. සභාපති හැටියට මාගේ ඉල්ලීම් නිසා නිලධාරීන් මේවා ඉටු කර දෙන මුත්, වෙනත් ආයතනවල කාර්යයන් ඔවුන්ගේ රාජකාරියත්, නොවන බැව් ප්‍රකාශ කරන්නත් ඕන.

මේ කාලයේ ඇති වී ඇති කොවිඩ් වසංගත තත්වය නිසා විෂබීජහරණ ක්‍රියාවලියට අපේ දායකත්වය විශාල වශයෙන් අවශ්‍ය වී තියෙනවා. සෑම ආයතනයක්ම විශේෂයෙන් පාසල්, පංසල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදී රජයේ ආයතන මෙන්ම පෞද්ගලික ආයතනද, පන්සල් වැනි ආගමික ස්ථානද, පෙර පාසල් ආදියද විෂබීජහරණය කිරීමට ඉල්ලීම් එනවා. මේ සඳහා අවශ්‍ය පුහුණු සේවකයන් අපට නොමැති වුනත්, දැනට සිටින සේවකයන් තුන්දෙනාගෙන් තමයි මාරුවෙන් මාරුවට මේ දේවල් ඉටු කර දෙන්නෙ. විෂබීජහරණයට ගියාම ඔවුන් නැවත සේවා ස්ථානයට ගෙන්වා ගන්නේ නැහැ. එම කාර්යය අවසන් වූ වහාම ගෙවල්වල යනවා. ඒ අනුව සභාවේ කිරීමට ඇති සේවාවන්ද හරියටම කර ගන්න බැහැ. ඒ නිසා තමයි මම යෝජනා කලේ, මේ වසංගත තත්වය නිසා සභාවට අලුතින් කම්කරුවන් 5 දෙනෙකු තාවකාලිකව බඳවා ගත යුතුයි කියා. තවද මේ දවස්වල නොයෙක් ස්ථානවල PCR පරීක්ෂණ කරන නිසා, ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම්ද අපෙන් ඉල්ලීම් කරන නිසා, ඒවා ලබාදීමටත් සිදුවනවා. ඉතිං මේ සියළු දේවල් කිරීමේ දී නොයෙකුත් අඩුපාඩු සිදුවන්න පුළුවන්. මම නිතරම සියළු ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන නිසා සියළුම දෙනා මා විශ්වාස කරලා, උදව් ඉල්ලනවා.

මේ අතරේ අපේ සිටින නිලධාරීන් ස්ථාන මාරුවීම් ලබනවා. විශේෂයෙන්ම පියල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි අවුරුදු 07 ක් පමණ දිගු කාලයක් අප සභාවේ සේවය කල තාක්ෂණ නිලධාරීතුමිය ස්ථාන මාරුවීම් ලැබ ගියා . ඇය සේවය කල කාලයේ හොඳ නරක දෙකම අහන්න ඇති. නමුත් ඇය සභාවට ලොකු ශක්තියක් වුණා. අපි ඇයගේ සේවය අගයනවා. ඇය සභාවේ සියළුම අය සමඟ සුහදව කටයුතු කරමින්, සැමගේ ආදරය දිනාගත්ත නිලධාරිනියක්.

ගරු මන්ත්‍රීවරුනි, අපි සභාවට පත්ව ආ පසු, විශේෂයෙන් මා සභාපති වුවාට පසුව, ජනතාව අපෙන් කෙරෙන ලොකුම ඉල්ලීම තමයි වීථි ලාම්පු. පසුගිය කාලයේ සභාවේ මූල්‍ය තත්වය අනුව අවශ්‍ය ස්ථානවල අලුතින් වීථි ලාම්පු යම් ප්‍රමාණයක් සවි කරමුත්, එය ප්‍රමාණවත් නොවන බවයි සියළු මන්ත්‍රීවරුන්ගේ මෙන්ම ජනතාවගේ මතය. මළ ගෙදරක ගියත්, මගුල් ගෙදරක ගියත්, මොනයම් උත්සවයකට ගියත් මගෙන් කෙරෙන ඉල්ලිමට සවන්දීලා, වර්තමානයේ සභාවේ මූල්‍ය තත්වය අනුව සියළුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉල්ලීම්වලට අනුව වීථි පහන් මිළදී ගෙන අවශ්‍ය ස්ථානවල

සවි කිරීමට මම කල්පනා කළා. මේ සඳහා අවට සභාවල සහයෝගයක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අද සභාවේ අදහස් ප්‍රකාශ කිරීමේදී කියවුනා. සොල්පවර් විදුලිය ලබා දීම් සම්බන්ධව. ලබන සභා වාරයට යෝජනාවක් ලෙස ඉදිරිපත් කොට, අපගේ ප්‍රධාන කාර්යාලයේ සහ උප කාර්යාලවල සවි කිරීමට බලාපොරොත්තු වෙනවා. තවද මේ වන විට ආදාහනාගාරය ඉදි කිරීම සඳහා වූ සියළු ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය ඇස්තමේන්තුද සකස් කොට අවසන් වුවද, ඉඩමේ වටිනාකම ඇස්තමේන්තු කර, එවන්න කියා අදාල අමාත්‍යාංශය මගින් ලිපියක් එවා තියෙනවා. මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ආදාහනාගාරය ඉදිකරන අක්කර 01 ක භූමියත්, අපගේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඇති ඇප්තොප්වත්ත ඉඩමේ අක්කර 05 ක භූමි ප්‍රමාණයත් තක්සේරු කර දෙන ලෙස අප ඉල්ලීම් කොට තියෙනවා. ඇප්තොප්වත්ත තක්සේරුව 1999 වර්ෂයේ අත්සන් කර ගන්නා විට වූ තක්සේරුවත්, ආදාහනාගාරයේ ඉඩම වත්මන් තක්සේරුවත් තමයි අපට ලබා ගත යුත්තේ. මම එම ඉල්ලීම කළා. මම තක්සේරු භාර නිලධාරියාගෙන් විමසුවාම ඔහු ප්‍රකාශ කල පරිදි, ඇප්තොප්වත්තට 1999 වර්ෂය නිසා අඩු තක්සේරුවක් පුළුවන් බවත්, ආදාහනාගාර ඉඩම වර්තමාන තක්සේරුවක් නිසා ටිකක් වැඩිවේ යැයි ප්‍රකාශ කළා. නමුත් මම ප්‍රකාශ කළේ, අපට ලබා දී ඇති ඉඩම කුමන වැවිල්ලකටවත් සුදුසු නැති අත්හැර ඇති ඉඩමක් නිසා අඩු තක්සේරුවක් ලබා දෙන ලෙසයි. මන්ද වතු සමාගමෙන් ඉල්ලන්නේ යම් තක්සේරු මුදලක් නිසා.

ගරු මන්ත්‍රීවරුනි, අද සභාවේ වර්තමාන සංවර්ධන යෝජනා පිළිබඳව කතා වුනා. සභාවක් හැටියට අපට සතුටු විය හැකි සංවර්ධනයක් මේ වන විට ක්‍රියාත්මකයි. ප්‍රධාන පාරවල් මෙන්ම අතුරු පාරවල්ද කාපට් කිරීම මේ වන විට අරඹලා තියෙන්නෙ. මාපලගම මහජන ක්‍රීඩා පිටිය බල ප්‍රදේශයේ ප්‍රධාන ක්‍රීඩාපිටිය බවට පත්වෙනවා. රු. ලක්ෂ 50 ක වියදමින් එය යථා කාලයේ සංවර්ධනය කරනවා. සෑම ක්‍රීඩා පිටියක්ම සංවර්ධනය කිරීමට ඉදිරියේදී මුදල් ලබා දෙන බවට අපට දැණුම් දිලා තියෙනවා. සෑම ගමකම නිවාස නොමැති මැටියෙන් තැනූ නිවාසවලට නව නිවාස ලබා දෙනවා. තේ දල්ලට ඉහල මිලක් ලැබෙනවා. මේ සියළුම දේවල් සිදුවන්නේ වර්තමානයේ ඇති වී ඇති කොවිඩ් අර්බුදයත් සමඟ බව අප අමතක කල යුතු නැත. සභාවක් හැටියට අපේ වගකීම් ඉටු කරනවා. අපේ පෙරපාසල්වල දරුවන්ට අවශ්‍ය නිල ඇඳුම් මේ වන විට ලබා දෙනවා. ඒ වගේම පෙරපාසල් හැරයන දරුවන් 245 දෙනෙකුට අවශ්‍ය පොත්පත් සහ අනිකුත් දේ ( රු. 1500.00 ක් පමණ වටිනා) මේ දිනවල ලබාදෙමින් යනවා. පෙරපාසල් ගැන ප්‍රකාශ කල නිසා මේ අවස්ථාවේදීම සඳහන් කල යුතුයි. අපේ හඟරංවල පෙර පාසලට අවශ්‍ය ජලය, නාකියාදෙණිය ඔයිල්ෆාම් ෆැක්ට්‍රියෙන් ලබා දුන්නා. මීට ප්‍රථම එම පෙර පාසලට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාදුන්නා. ඒ පිළිබඳව මේ අවස්ථාවේ ස්තූතිය ප්‍රකාශ කරනවා. මෙය ලිපියකින් දන්වන ලෙස ලේකම්තුමිය දැනුවත් කරනවා.

මම මේ ඉහත කරුණු කියා පෑවේ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමේ ප්‍රකාශ වූ කරුණු මත. මම හිතුවා වසන්ත මන්ත්‍රීතුමාට කොවිඩ් ආශ්‍රිත රෝගයක් හැදිලාද කියා. බැලුවට එහෙම දෙයකුත් නැහැ. ගරු මන්ත්‍රීවරුනි, මම ප්‍රකාශ කරන්න කැමතිය. මෙතන අතිගරු ජනාධිපතිතුමාගේ නමත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ නමත් ප්‍රකාශ වුනා. ඔවුන් දෙපල නොහිටියානම්, අද මේ රට විශාලා මහනුවරක්. මතක තියාගන්න පළමු කොවිඩ් රැල්ල මර්ධනය කර, ලෝකයේ දෙවන තැනට පත්වූ අපගේ දෙවන කොවිඩ් රැල්ල මේ වන විට විශාල වශයෙන් ව්‍යාප්ත වන්නේ අපගේ නොසැළකිලිමත් බව නිසා. නමුත් එයද මර්ධනය කරන බව කියන්න කැමතියි. මේ කොවිඩ් රැල්ලට ඔබතුමාගේ බිරිඳද ගොදුරු වුණා. ඒ එතුමිය සේවය කල බන්ධනාගාරයේ වෛරසය ආසාධිත රැදවියන් නිසා. ඒ තමන්ගේ රාජකාරි ඉටුකරන්නට ගොස්. දරුවන්ටත් පසුව රෝගය වැළඳුනා. මෙම රෝගයට තනතුරු, වයස, ලොකු පොඩි භේද බලපාන්නේ නැහැ. මෙම රෝගය අපට දෙන පණිවිඩය බොහොම භයංකරයි. ඒ නිසා මේ රෝගය

පැතිරී ඇති පළාත්වලට යන්න පවා බය වෙනවා. නමුත් අප වනමල් මන්ත්‍රීතුමා පිළිබඳව නිතර සොයා බැලුවා. දුරකථන මාර්ගයෙන් සම්බන්ධ වුණා. මොකද මේ මන්ත්‍රීතුමා සියළු දෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කරන මන්ත්‍රීවරයකු හැටියට දුකේදී සැපේදී සෑම තැනකම පෙනී සිටින නිසා. අපේ සභාවේ තිබුන දානයටත් උදව් වෙලා තමයි එදා ගියේ

ගරු මන්ත්‍රීවරුනි, මේ වසංගත තත්වය මත විවිධ බඩුවල මිළ ඉහළ ගොස් ඇති බව ඇත්ත. නමුත් රජය නොයෙකුත් ක්‍රියාමාර්ග ගනිමින් ජනතාවට අවශ්‍ය සහන ලබාදෙනවා. අපේ මිනිසුන්ගේ සිරිතක් තමයි කල දුටු කල වල ඉහගැනීම. මන්ද මෙවැනි ආපදා අවස්ථාවලදී රජයටම විතරක් සෑම දෙයක්ම ඉටු කිරීමට නොහැකියි. ජනතාවත් ටිකක් නම්‍යශීලී වන්න දැන ගන්න ඕන.
ඔබතුමන්ලා ප්‍රකාශ කල පරිදි රජය ෆේල් නැහැ. යහපාලන රජය තිබුනානම්, ප්‍රථිඵල බලාගන්න තිබුණා. රජය ෆේල් නම්, අද දින රැස්වීමවත් තියාගන්න අපට බැරිවෙනවා. ඒ නිසා අපි ටිකක් ඉවසමු.

ඒ වගේම වනිගරත්න මන්ත්‍රීතුමාගෙ ගල් බැඳි දොළ පාලම පිළිබඳව දොලොස් වෙනිදා සංවර්ධන කමිටුවෙදි කතා කරමු. ඒ වගේම මාපලගම අපේ ක්‍රීඩාංගනය තමයි අපේ බල ප්‍රදේශයේ ක්‍රීඩාංගනය හැටියට සංවර්ධනය කරන්න යෝජනා කරල දීල තියෙන්නෙ. යථා කාලෙදි ඒ සංවර්ධන කටයුතු කෙරෙයි කියලා බලාපොරොත්තු වෙනවා. මොකද අපි ඉල්ලල තිබුනෙ මාපලගම ප්‍රධාන ක්‍රීඩාංගනය. ඒ නිසා තමයි ඒක අපි නම් කරල යැව්වෙ.

එහෙමනම් මීට වඩා වැඩි යමක් කියන්න යන්නෙ නැහැ. අපේ සභාවෙ මන්ත්‍රීවරුන් සුහදත්වයෙන් කටයුතු කිරීම පිළිබඳව ඇත්තටම සතුටු වෙනවා. අනාගතේ මම බලාපොරොත්තු වෙනවා. බල ප්‍රදේශයේ අත්‍යාවශ්‍යම ස්ථානවලට වීථි පහන් සවි කිරීමේ කටයුතු සිදු කරනවා. ඒ සඳහා සියලුම දෙනාගේ යෝජනා අනුව අවශ්‍ය තැන්වලට ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වගේම ලක්‍ෂ දෙකේ ව්‍යාපෘතිය යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක වෙන කටයුතු ඉතා සාර්ථකව කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකට ඔබතුමන්ලා, මේ අදාල නිලධාරීන් සම්බන්ධ කරගෙන ඒ කටයුතු ඉක්මනින් කර ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම කොවිඩ් රැල්ල අප්‍රේල් මාසය වන විට රටෙන් තුරන් කිරීමට අපි පෙළ ගැසෙමු. සෞඛ්‍ය නීතිරීති පිළිපදිමු. එකම රටක්, එකම ජාතියක්, එකම නීතියක් යටතේ ඉදිරියට යමු. ඔබ සියළු දෙනාට සුභ අනාගතයක් පතමින්, සභාව මෙතනින් නිම කරනවා. සියලු දෙනාට ජය වේවා!

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-

ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුනි, මම අපේ සමන් මන්ත්‍රීතුමාට සිදු වුන සිදු වීම පිළිබඳව පළමුවෙන්ම කියන්න කැමතියි. අපේ එක තාක්ෂණ නිලධාරී මහත්මයෙක් ඔහුගේ විවාහ උත්සවය සඳහා නිවාඩු ලබාගෙන තියෙනවා. අනිත් තාක්ෂණ නිලධාරීතුමිය ස්ථාන මාරුවීමක් ලැබිල වෙනත් සේවාස්ථානයකට ගියා. අලුතෙන් තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙක් මේ ආයතනයට ආවා. සමන් මන්ත්‍රීතුමාගේ කටයුත්ත සඳහා තාක්ෂණ නිලධාරියෙක් අපි යැව්වා. නමුත් මොනව හරි අතපසු වීමක්

වෙලා තියෙනවා. ඒ පිළිබඳව අපි කණගාටුව ප්‍රකාශ කරනවා. නමුත් නිලධාරින්ගෙම වැරැද්දක් නිසාම නෙවෙයි. මේ කාල වකවානුවත් එක්ක සිදු වුන සිදුවීම් නිසා තමයි මම හිතන්නෙ ඒ සිදුවීම වුනේ. විශේෂයෙන්ම අපේ වනිගරත්න මන්ත්‍රීතුමා කිව්ව වගේ දැන් මේ සභාවට තමයි හැම දෙයක්ම යොමු කරන්නෙ. පාසල්වල ඒවත් වෙනත් ආයතනවල ඒවත් ඇස්තමේන්තු කරන්න හැම දෙයක්ම යොමු කරන්නෙ සභාවට. උදවුවක් වශයෙන් කරනවා මිසක් අපට ඒකෙන් ලැබෙන ප්‍රතිලාභයක් නැහැ. එහෙම කරන්න ගියාම තමයි අපහසුතාවයට පත්වෙන්නෙ. මේ නාගොඩ රාජකීය ජාතික පාසලේ කම්කරුවො 13 දෙනෙක් ඉන්නවා. විෂබීජහරණයට අපෙන් කම්කරුවන් ඉල්ලන්නෙ. ඊයෙත් විෂබීජහරණය කළා. මම විදුහල්පතිතුමාට කිව්වා. ඉතිං මේ කටයුතු කළත් ප්‍රශ්න. නොකළත් ප්‍රශ්න. හැම ආයතනයක්ම එහෙමයි. පී.එච්.අයි. මහත්වරු නර්ස් එක්ක යන්නත් කැබ් එක ඉල්ලනවා. නොදුනත් ප්‍රශ්න. දුන්නත් ප්‍රශ්න. හැම තැනදිම ප්‍රශ්න ඒ මැද ඉදගෙන තමයි මම මේ කටයුතු කරන්නෙ. හැම විටම ඒ ප්‍රශ්නවලට අපි මැදි වෙලා ඉන්නෙ. ඒ නිසයි මම අර කම්කරු ප්‍රශ්නෙත් කතා කළේ. අපේම අඩුපාඩුවක්ම නිසා නෙවෙයි. යම් යම් රාජකාරි කිරීමෙදි මගෙත් අඩුපාඩු තියෙනවා. මේ සභාවට අදාලව නීති සහ රීති තියෙනවා. මේව හරියට ක්‍රියාත්මක වුනොත් අද සභාවෙන් භාගයක් මෙතන නැහැ. ඒව ක්‍රියාත්මක නොකර කවුරුත් එක හා සමානව යම්කිසි දෙයක් කරන්න ඕන නිසා තමයි මේ කටයුතුවල යෙදෙන්නෙ.

ගරු මන්ත්‍රීවරුනි, අපේ ගරු පියල් මන්ත්‍රීතුමා කිව්ව වගේ අපේ එක තාක්ෂණ නිලධාරීතුමියක් අවුරුදු හතක් මේ ආයතනයේ සේවය කරලා ගිය සිකුරාදා වෙනත් ආයතනයකට සභාවෙන් නික්ම ගියා. ඒකත් සිහිපත් කරනවා. ඒවගේම එතුමිය කරපු සේවාව පිළිබඳව ස්තූති කරනවා. අඩුපාඩු තියෙන්න ඇති. කොහොම නමුත් අවුරුදු හතක් මේ ආයතනයේ සේවය කළා. සුහදව කටයුතු කළා. ඒ පිළිබඳවත් මතක් කරමින්, විශේෂයෙන්ම මේ දිනවල අපේ පෙර පාසල් සඳහා අපේ යෝජනාවක් අනුව විධිමත් අධ්‍යාපනය ලබන්න යන ළමයි 245 ක් වෙනුවෙන් අපි රුපියල් දහසකට ආසන්න තෑගි පාර්සලයක් සහ ඊලගට මේ වසරේ ඇතුලත් වූ නව ළමුන්ට නිල ඇදුම් කට්ටලයක් දීගෙන යනවා. සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න කියලා මම කිව්වා. ඒ කටයුත්ත ඊයෙ ඉදල පටන් ගත්තා. අදාල මන්ත්‍රීවරුන් සම්බන්ධ කළා.

ඒ එක්කම අලුතෙන් තාක්ෂණ නිලධාරී දෙන්නෙක් ඇවිත් ඉන්නවා. ඒ දෙන්නත් දැන් වැඩ කරගෙන යනවා. නව පත්වීම් දෙකක්. ඊලගට ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ බල ප්‍රදේශයටම සෑහෙන වීථි පහන් අදාල ස්ථානවලට දාන්න අපේ බලාපොරොත්තුවක් තියෙනවා. සියලු මන්ත්‍රීවරුන්ගෙ යෝජනා අරගෙන අවශ්‍ය තැන්වල සවි කරන්න කටයුතු කරනවා. ඉදිරියෙදි ආසන්න ප්‍රාදේශීය සභාවල විදුලි කාර්මිකයනුත් ගෙන්වල අවශ්‍ය තැන්වලට විදුලි පහන් සවි කිරීමට, මුදල් වෙන් කරලා තියෙනවා. යම් අඩුපාඩු වුනත් ඒක සාධාරණීකරණය කරල අවශ්‍යම ස්ථානවල වීථි පහන් සවි කරන්න. මම ඉදිරියෙදි බලාපොරොත්තුවෙනවා. මම මළ ගෙවල්වලට ගියාම, තුන් හතර දෙනා ඇවිල්ල අපේ ලයිට් එක හදල දෙන්න කියලා කියනවා. මම කිව්වා අදාල මන්ත්‍රීතුමාට කියන්න. මන්ත්‍රීතුමා කියනවලු වැඩක් නැත. දෙන්නෙ නැතෙයි කියලා. යටලමත්තෙදිම එහෙම වුනා. විජිත් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ තුන් දෙනෙක් ආවා. මම කිව්ව මන්ත්‍රීතුමාට කියන්න. මොකද දිය යුතු තැනක්ද නැද්ද කියල මේ කොට්ඨාසෙ ගැන මම දන්නෙ නැහැ කියලා. මන්ත්‍රීතුමාට කිව්වම අනේ වැඩක් නැත කිව්වලු සභාපතිතුමාට කිව්වට දෙන්නෙ නැත කිව්වලු. මම කිව්ව මන්ත්‍රීතුමා බේරෙන්න එහෙම කියනවා. ඇත්තටම විදුලි උපකරණත් නැහැ. යථා කාලෙදි කරනවා කියලා. මේ කොට්ඨාස ක්‍රමෙත් එක්ක හරි අපහසුයි වැඩකටයුතු කරන්න.

ඒ වගේම මම මේ අවස්ථාවෙ ඔබතුමාලගෙ ඉල්ලීම පරිදි, සෝලා පවර් අපේ ප්‍රධාන කාර්යාලයේත්, උප කාර්යාලවලත් සවි කිරීමට යෝජනාවක් හැටියට ලබන සභාවට ඉදිරිපත් කරනවා. ඊලගට අපි ඇප්තොප්වත්තටයි අදාහනාගාරය ඉදිකරන ඉඩමටයි තක්සේරු වාර්තාව ඉල්ලුම් කරලා තිබුනා. ඒ සඳහා තක්සේරු කරන්න ගිය සුමානෙ ආවා. ඇප්තොප් වත්ත සඳහා 1999 යෙ ඉඩම පවර ගත්ත

කාලෙ අනුව නම් බොහොම අඩුවෙන් අපට තක්සේරුව එන්නෙ. වර්ථමාන තක්සේරුව අනුව නම් ලක්ෂ ගණනක තක්සේරුවක් එනවයි කිව්වා. මම කිව්වා අඩු තක්සේරුවක් අපට ලබා දෙන්න කියලා. නාගොඩ වත්ත නම් අපට නොමිලේ ලබා දෙන්න තමයි කටයුතු කරල තියෙන්නෙ. නමුත් බොහොම පොඩි තක්සේරුවක් හරි කරන්න වෙයි කියල තමයි ඇල්පිටිය වතු සමාගමෙන් අපට කිව්වෙ. ඒ කටයුතු යථා කාලෙදි සිදු වෙනවා.

ඒ වගේම, අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්ව වගේ මේ රජය පත්වෙලා. කාටවත් නොපෙනුනාට, ලොකු වැඩ කොටසක් කරල තියෙනවා. එතුමා කිව්වා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගෙ හා බැසිල් රාජපක්ෂ මැතිදුන්ගෙ නම් මෙතන ප්‍රකාශ වුනා. ගරු මන්ත්‍රීතුමනි, මේ කොවිඩ් වසංගතය අපි හිතල මතල හදා ගත්ත වසංගත රෝග තත්වයක් නෙවෙයි. ලෝක වසංගතතත්වයක්. ඔබතුමාල ඇත්තටම සතුටු වෙන්න ඕන. ඒ ගෝඨාභය මැතිදුන්ගෙ ක්‍රියා කලාපය නිසා. කොවිඩ් වසංගතය මේ තරම් දුරට මේ වෙන කොට මර්ධනය වෙලා තියෙනවා. මම ගිය වරත් කිව්වෙ අප්‍රේල් මාසෙ වෙන කොට ලංකාවෙන් මේ කොවිඩ් වසංගත තත්වය දුරු වේවි. දුරු කිරීමට කටයුතු කරනවා. මේ වෙන කොටත් මදක් පහ වී යමින් තියෙන්නෙ. පළවෙනි රැල්ල මර්ධනය කළාට පස්සෙ දෙවනි රැල්ල ඇතිවෙන කොට මේ පිළිබඳව අපේ හැඟීමක් තිබුනෙ නැහැ. ඒ වගේම තමයි වර්ථමානෙ මේ වෙන කොටත් දැන් අපි විසින්මයි මේක ව්‍යාප්ත කර ගන්නෙ. ඒ නිසා මම එදා කිව්වෙ ගරු මන්ත්‍රීවරුන්ට අපි වැනි අයට මේ රෝගය බෝ වුනොත් භයානකයි. හේතුව අපි හැම තැනම ඇවිදින අය නිසා. විශේෂයෙන්ම අපේ වනමල් ගරු මන්ත්‍රීතුමා, මේ රෝගය පිළිබඳව අපි දැනගත් විගස දුරකතනයෙන් සම්බන්ධ වෙන්න බැලුවා. පළවෙන් අවස්ථාවෙ බැරි වුනා. වනමල් මන්ත්‍රීතුමාගෙ හදිසි තත්වය නිසා අපේ සභාවෙ සියලු මන්ත්‍රීවරු ඇත්තටම කණගාටු වුනා. මේ මන්ත්‍රීතුමා එදා අපේ දානෙටත් ඇවිල්ලා ඒ කටයුතුවලට සහයෝගය දක්වලා ගියාට පස්සෙ තමයි මේ කටයුත්ත සිදු වුනේ. විශේෂයෙන්ම එතුමාගේ නෝනා බන්ධනාගාරයේ සේවය කරන්නෙ. එතුමියට වැලඳුනේ බන්ධනාගාර රැඳවියන්ට රෝගය වැලඳී තිබුන නිසා. ඇය ඔවුන්ගේ ආශ්‍රිතයෙක් වූ නිසා. එතුමියවත් ඒක දැනගෙන හිටියෙ නැහැ. පී.සී.ආර්. පරීක්ෂණයෙන් පස්සෙ තමයි දැනගන්න ලැබුනෙ.